91 වන කාණ්ඩය
3 වන කලාපය

ඉරිද
1970 ඔක්තෝබර් 11

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ

නිල වාර්තාව

### අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රශ්නවලට වාචික පිළිතුරු [තී. 169]

ලංකා (ආණ්ඩු ක්‍රම සහ ස්වාධීනතා) සංශෝධන පනත් කෙටුම්පත [තී. 182] :

පළමුවන වර කියවන ලදී.

ආහාර පාලන නියෝග [තී. 183]

නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය : වාර්ෂික වාර්තා—(1963-64 ; 1964-65 සහ 1965-66) [තී. 185]

නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත [තී. 215] :

දෙවන වර සහ තුන්වන වර කියවා, සංශෝධිතාකාරයෙන්, සම්මත කරන ලදී.

දෙවන වර සහ තුන්වන වර කියවා සම්මත කරන ලද පනත් කෙටුම්පත් [තී. 255] :

ලංකා (ආණ්ඩු ක්‍රම) (සංශෝධන) පනත් කෙටුම්පත

ප්‍රාදේශිය බල මණ්ඩල ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත

බැංකු හර බදු පනත් කෙටුම්පත

කල් තැබීමේ යෝජනාව [තී. 272]

ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු [තී. 283]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

தொகுதி 91
இல. 3

ஞாயிற்றுக்கிழமை
11 ஒக்ரோபர் 1970

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

## பிரதிநிதிகள் சபை

அதிகார அறிக்கை

பிரதான உள்ளடக்கம்

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப. 169]

இலங்கை (அரசமைப்பும் சுதந்திரமும்) (திருத்தம்) மசோதா [ப. 182]:
முதன்முறை மதிப்பிடப்பட்டது

உணவுக் கட்டுப்பாட்டுக் கட்டளைகள் [ப. 183]

கிழக்கிலங்கைக் கடதாசி ஆலைக் கூட்டுத்தாபனம்: வருடாந்த அறிக்கைகள் (1963-64, 1964-65, 1965-66) [ப. 185]

வாடகைக் குடியிருப்பாளர் பாதுகாப்பு (சிறப்பேற்பாடுகள்) மசோதா [ப. 215]:
இரண்டாம் மூன்றும் மதிப்புக்களிடம் பெற்று, திருத்தப்பட்டவாறு நிறைவேற்றப் பட்டது

இரண்டாம் மூன்றும் மதிப்புக்களிடம் பெற்று நிறைவேற்றப்பட்ட மசோதாக்கள் [ப. 255]:
இலங்கை (அரசியலமைப்பு) (திருத்தம்) மசோதா
உள்ளூராதிகார சபைகள் தேர்தல்கள் (திருத்தம்) மசோதா
வங்கிப்பற்றுக்கள் வரி மசோதா

ஒத்திவைப்புப் பிரேரணை [ப. 272]

வினாக்களுக்கு வாய்மூல விடைகள் [ப. 283]

Volume 91
No. 3

Sunday
11th October 1970

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## HOUSE OF REPRESENTATIVES

OFFICIAL REPORT

PRINCIPAL CONTENTS

ORAL ANSWERS TO QUESTIONS [Col. 169]

CEYLON (CONSTITUTION AND INDEPENDENCE) AMENDMENT BILL [Col. 182]:
Read the First Time

FOOD CONTROL ORDERS [Col. 183]

EASTERN PAPER MILLS CORPORATION—ANNUAL REPORTS (1963-64, 1964-65 and 1965-66) [Col. 185]

PROTECTION OF TENANTS (SPECIAL PROVISIONS) BILL [Col. 215]:
Read a Second, and the Third Time, and passed, as amended

BILLS READ A SECOND, AND THE THIRD TIME, AND PASSED [Col. 255]:
Ceylon (Constitution) Amendment Bill
Local Authorities Elections (Amendment) Bill
Bank Debits Tax Bill

ADJOURNMENT MOTION [Col. 272]

WRITTEN ANSWERS TO QUESTIONS [Col. 283]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# නියෝජිත මන්ත්‍රී මණ්ඩලය
## பிரதிநிதிகள் சபை
## House of Representatives

### 1970 ඔක්තෝබර් 11 වන ඉරිදා
*ஞாயிற்றுக்கிழமை, 11 ஒக்ரோபர் 1970*
*Sunday, 11th October 1970*

---

**අ. භා. 2 ට මන්ත්‍රී මණ්ඩලය රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [අයි. ඒ. කාදර් මයා.] මූලාසනාරූඪ විය.**

*சபை, பி. ப. 2 மணிக்குக் கூடியது. உப சபாநாயகர் அவர்கள் [ஜனாப் ஐ. ஏ. காதர்] தலைமை தாங்கினார்கள்.*

*The House met at 2 P.M., MR. DEPUTY SPEAKER [MR. I. A. CADER] in the Chair.*

---

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
### சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
### PAPERS PRESENTED

(20 වැනි අධිකාරය වන) අපරාධ නඩු විධාන සංග්‍රහයේ 253 (අ) වැනි වගන්තිය යටතේ මුදල් ඇමති විසින් පනවන ලදුව, 1970.9.4 වැනි දින අංක 14,922 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද නියෝගය.—[මුදල් ඇමති වෙනුවට ගරු ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා]

**සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*சபாபீடத்தில் இருக்க கட்டளையிடப்பட்டது.*

*Ordered to lie upon the Table.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
### வினாக்களுக்கு வாய்மூல விடைகள்
### ORAL ANSWERS TO QUESTIONS

### කොළඹ විශ්ව විද්‍යාලය : කථිකාචාර්යවරු, පොත්
*கொழும்பு பல்கலைக்கழகம் : விரிவுரையாளர், நூல்கள்*

UNIVERSITY OF COLOMBO : LECTURERS, BOOKS

2. **කේ. ජෙයකොඩි මයා.** (උඩුප්පිඩ්ඩි)
*(திரு. கே. ஜெயக்கொடி—உடுப்பிட்டி)*
(Mr. K. Jeyakkody—Uduppiddy)

අධ්‍යාපන ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) කොළඹ විශ්ව විද්‍යාලයේ කලා අංශයට අවශ්‍ය කථිකාචාර්ය සංඛ්‍යාව නොමැති බව එතුමා දන්නවාද? (ආ) අවශ්‍ය කථිකාචාර්ය සංඛ්‍යාව පත්කිරීමට එතුමා පියවර ගන්නේද? (ඉ) කොළඹ විශ්ව විද්‍යාල පුස්තකාලයේ ඇති සිංහල ග්‍රන්ථ සහ ද්‍රවිඩ ග්‍රන්ථ සංඛ්‍යාව කොපමණද? (ඊ) ද්‍රවිඩ අංශයට අවශ්‍ය පොත් ලැයිස්තු කථිකාචාර්යවරුන් විසින් පුස්තකාලයාධිපතිට සපයා ඇති නමුදු එම පොත් මිළදී ගෙන නොමැති බව එතුමා දන්නවාද? (උ) එසේ නම් එම පොත් මිළදී ගැනීමට ක්‍රියා කරන්නේද?

*கல்வி அமைச்சரைக் கேட்ட வினா: (அ) கொழும்பு பல்கலைக்கழகத் தமிழ்க் கலைப் பகுதிக்குப் போதிய விரிவுரையாளர்கள் இல்லை என்பதை அவர் அறிவாரா? (ஆ) போதிய விரிவுரையாளரை நியமிக்க நடவடிக்கை எடுக்கப்படுமா? (இ) கொழும்பு பல்கலைக் கழக நூல்நிலையத்தில் எத்தனை தமிழ் நூல்கள் இருக்கின்றன? எத்தனை சிங்கள நூல்கள் இருக்கின்றன? (ஈ) தமிழ்ப் பகுதிக்கு அவசியமானதென நூல்களின் பட்டியல்கள் விரிவுரையாளர்களால் நூல் நிலையப் பொறுப்பதிகாரியிடம் கொடுக்கப்பட்டும் அந் நூல்கள் வாங்கப்படவில்லை என்பதை அவர் அறிவாரா? (உ) அங்ஙனமாயின் அந்நூல்கள் வாங்க நடவடிக்கை எடுக்கப்படுமா?*

asked the Minister of Education: (*a*) Is he aware that the required number of lecturers are not available in the Arts Faculty of the University of Colombo? (*b*) Will action be taken to appoint the required number of lecturers? (*c*) How many Tamil books and how many Sinhala books are available in the library of the University of Colombo? (*d*) Is he aware that, although lists of books necessary for the Tamil section have been provided to the librarian by the lecturers, those books have not been purchased? (*e*) If so, will action be taken to buy those books?

**බී. වයි. තුඩාවේ මයා. (අධ්‍යාපන ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. பி. வை. துடாவ—கல்வி அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. B. Y. Tudawe—Parliamentary Secretary to the Minister of Education)

(අ) එසේය. (ආ) පුරප්පාඩු වී ඇති සියලුම තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර දැනටම කැඳවා ඇති බවත්, සුදුසු අයදුම්



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[තුඩාවේ මයා.]

කරුවන් ඇති විට සියලුම පුරප්පාඩු පිර වීමට කටයුතු කරන බවත් එම විශ්ව විද්‍යාලයයේ ලේකම් මා වෙත දන්වා ඇත. (ඉ) සිංහල මාධ්‍යයෙන් වූ ග්‍රන්ථ සිංහල ග්‍රන්ථ මාතෘකා—2,351 ; මුළු වෙළුම් ගණන—15,255. දෙමළ මාධ්‍යයෙන් වූ ග්‍රන්ථ : ද්‍රවිඩ ග්‍රන්ථ මාතෘකා—728 ; මුළු වෙළුම් ගණන—1,623. පසුගිය වර්ෂයේ (1969-70) විශ්ව විද්‍යාලයයේ සිටි ශිෂ්‍ය සංඛ්‍යාව මෙසේ ය : මානව ශාස්ත්‍ර පීඨය සිංහල—202 ; දෙමළ—30. සමාජ විද්‍යා පීඨය සිංහල—1,697 ; දෙමළ—147. (ඊ) සමාජ විද්‍යා පීඨය සඳහා ඉල්ලුම් කරන ලදුව පීඨාධිපති විසින් අනුමත කරන ලද පොත් මිලයට ගෙන තිබේ. මානව ශාස්ත්‍ර පීඨය මගින් ඉල්ලුම් කරන ලද සියලුම ද්‍රවිඩ පොත් සඳහා ඇනවුම් කිරීමට නොහැකි වූයේ එම පොත් පිළිබඳව වැඩිදුර විස්තර පේරාදෙනිය ශ්‍රී ලංකා විශ්ව විද්‍යාලයෙන් ලබා ගැනීමට සිදුවූ නිසාය. (උ) කොළඹ විශ්ව විද්‍යාලයයේ ද්‍රවිඩ මාධ්‍යයෙන් පන්ති දිගටම පවත්වාගෙන යාම සඳහා තීරණයක් ගනු ලැබුණහොත් අවශ්‍ය පොත් සඳහා ඇනවුම් යවනු ඇත.

## ගාල්ලේ ඩබ්ලිව්. ගුණවර්ධන මහතා : නිවාස ණය

## திரு. டபிள்யூ. குணவர்த்தன, காலி : வீடமைப்புக் கடன்

## MR. W. GUNEWARDENA, GALLE : HOUSING LOAN

4. ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ගාල්ල)
(கலாநிதி டபிள்யு. தஹநாயக்க—காலி)
(Dr. W. Dahanayake—Galle)

නිවාස හා ගොඩනැගිලි ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) ගාල්ලේ වක්වැල්ල පාරේ අංක 455/5 දරන ස්ථානයේ ඩබ්ලිව්. ගුණවර්ධන මහතා, සිය පරණ නිවාසය ගංවතුරෙන් විනාශ වී ගිය හෙයින් අළුත් නිවාසයක් සාදා ගැනීමට රු. 2,000ක ණය මුදලක් ඉල්ලුම් කළ බව එතුමා දන්නවාද ? (ආ) එවැනි ණය මුදල් දීම ප්‍රතිපත්තිය නොවන බව ප්‍රකාශ කර ඇති හෙයින්, ඉල්ලුම් කරන ලද ණය මුදල ඔහුට දී නැති බව එතුමා දන්නවාද ? (ඉ) මේ පිළිබඳ නියම ප්‍රතිපත්තිය කුමක්ද ? (ඊ) ගුණවර්ධන මහතා ඉල්ලුම් කළ ණය මුදල එතුමා ඔහුට දෙනවාද ?

வீடமைப்பு, நிர்மாண அமைச்சரைக் கேட்ட வினா: (அ) வெள்ளத்தினால் அழிக்கப்பட்ட தமது பழைய வீட்டைத் திருத்துவதற்கு காலி, வக்வல வீதி 455 இல் வசிக்கும் திரு. டபிள்யூ. குணவர்த்தன ரூ. 2000 கடன் கோரியிருந்தாரென்பதை அறிவாரா? (ஆ) இவ்விதமான கடன்கள் கொடுக்கப்படுவதில்லை யென்ற கொள்கையால் இவருக்கு இக்கடன் கொடுபடவில்லையென்பதை அறிவாரா? (இ) உண்மையான கொள்கையென்ன? (ஈ) திரு. குணவர்த்தன் கோரியுள்ள கடனை வழங்குவாரா?

asked the Minister of Housing and Construction: (*a*) Is he aware that Mr. W. Gunewardena, 455/5, Wakwella Road, Galle, applied for a loan of Rs. 2,000 to put up a new house as his old house had been destroyed by the floods ? (*b*) Is he aware that he has not been given the loan asked for, because it is stated the policy is not to give such loans ? (*c*) What exactly is the policy ? (*d*) Will he grant the loan Mr. Gunewardena has asked for ?

ගරු පී. ජී. බී. කෙනමන් මයා. (නිවාස හා ගොඩනැගිලි ඇමති)

(கௌரவ பீ. ஜீ. பி. கெனமன்—வீடமைப்பு, நிர்மாண அமைச்சர்)

(The Hon. P. G. B. Keuneman—Minister of Housing and Construction)

(*a*) Mr. Wilmot Gunewardena of No. 455/5A, Wakwella Road, Galle, had applied on 28th February 1970 for a loan of Rs. 2,000 for the construction of a new house on his land at Kumbalwella which, he had declared in his application, was not subject to floods. (*b*) He has not yet been granted this loan. (*c*) Loans to construct houses damaged by floods are also granted where the security of the loan is the land on which the housing object is to be carried out, and the loan is limited to a percentage value of the land. (*d*) The grant of a loan to Mr. Gunewardena will be considered when applications for loans received in 1970 are taken up.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## වඩමරච්චි හින්දු බාලිකා විද්‍යාලය : වැඩි ගුරුවරු

வடமராட்சி இந்து மகளிர் பாடசாலை : மேலதிக ஆசிரியர்

## VADAMARADCHY HINDU GIRLS' COLLEGE : EXCESS TEACHERS

5. කේ. ජේයකොඩි මයා.
(திரு. ஜெயக்கொடி)
(Mr. K. Jeyakkody)

අධ්‍යාපන ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) වඩමරච්චි හින්දු බාලිකා විද්‍යාලය පවරා ගැනීමට විරුද්ධව ශ්‍රේෂ්ඨාධිකරණයේ පවරා ඇති නඩුව බේරුම් කර ලීමේ බලාපොරොත්තුවෙන්, අධ්‍යාපන අධ්‍යක්ෂ තැන තමාගේ අංක N.S.B 109, ඔබේ අංක J. A. M. 400 හා 12.3.62 දින දරන ලියුමෙන්, එම විද්‍යාලයයේ පාලක යන් සමග එක්තරා බේරුම් කිරීමේ කොන්දේසි කිහිපයකට එකඟ වූ බව එතුමා දන්නවාද? (ආ) වැඩිපුර සිටින ගුරුවරුන්ගේ නම් විශේෂ පොරොත්තු ලැයිස්තුවකට ඇතුළත් කොට ඇබෑර්තු ඇති වූ විටෙක පත්වීම් දීම සඳහා සැලකිල්ලට භාජන කරනු ලබන බව, ඉහත කී බේරුම් කිරීමේ කොන්දේසිවලින් එකක් වූ බව, එතුමා දන්නවාද? (ඉ) ගුරුවරුන් තෝරා ගැනීම සඳහා දැන් ඉල්ලුම්පත් භාරගනු ලබන හෙයින්, එතුමා එකී ගුරුවරුන්ට පත්වීම් දෙනවාද?

*கல்வி அமைச்சரைக் கேட்ட வினா: (அ) வடமராட்சி இந்து மகளிர் பாடசாலை அரசிற்குரிமை ஆக்கப்பட்டதை எதிர்த்து அப்பாடசாலையின் முகாமையானது உயர் நீதிமன்றத்தில் தொடர்ந்த வழக்கில் இணக்கங் காண்பதற்கென, JAM 400 இலக்கமும் 12.3.62 தேதியும் இடப்பட்ட மேற்படி முகாமையின் திருபம் குறித்து அக்காலத்து கல்வி அதிபர் எழுதிய NSB 109 இலக்க நிருபத்தின் மூலம் சில இணக்க நிபந்தனைகளுக்கு உடன்பட்டார் என்பதை அவர் அறிவாரா? (ஆ) "மேலதிகமாயுள்ள ஆசிரியர்களின் பெயர்கள் பிரத்தியேகப் பட்டியல் ஒன்றில் வைத்து வெற்றிடங்கள் வரும் பொழுது நியமனத்திற்கு கவனிக்கப்படும்" என்பது இவ்விணக்க நிபந்தனைகளுள் ஒன்றென்பதை அவர் அறிவாரா? (இ) ஆசிரியர்கள் தெரிவிற்கு விண்ணப்பங்கோரும் இத்தருணத்தில் இவர்களுக்கு நியமனங்கள் வழங்குவாரா?*

asked the Minister of Education: (*a*) Is he aware that the then Director of Education by his letter No. N.S.B. 109 Yr. No. J. A. M. 400 of 12.3.62 entered into certain terms of settlement with the management of the Vadamaradchy Hindu Girls' College with a view to settling the case before the Supreme Court filed against the vesting of this college? (*b*) Is he aware that one of the terms of settlement was that " the names of the excess teachers will be placed on a special waiting list and considered for appointment if and when vacancies arise " ? (*c*) Now that applications are being called for selecting teachers, will he give them appointments?

තුඩාවේ මයා.
(திரு. துடாவெ)
(Mr. Tudawe)

(අ) එසේය. (ආ) එසේය. (ඉ) පුරප්පාඩු ඇතිවන පරිදි හා ඇතිවූ විට අපේක්ෂකයන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවීමෙන්, නොයෙකුත් වර්ගවලට අයත් ගුරුවරුන් සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටි අනුව, ගුරු තනතුරුවලට බඳවා ගනු ලැබේ. ප්‍රශ්නයට අදාළ ගුරුවරුන්ද, ප්‍රසිද්ධ කරනු ලබන තනතුරුවලට ඉල්ලුම් කරන්නේ නම්, පත්වීම් දීම සඳහා ඔවුන්ගේ සුදුසුකම් අනුව, අනෙකුත් අයදුම්කරුවන් සමග සලකා බලනු ලැබේ.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)
Question No. 6.

ගරු සෙනරත් සෝමරත්න (වාරිමාර්ග, විදුලි බලය හා මහාමාර්ග පිළිබඳ වැඩ බලන ඇමති)
(கௌரவ செனரத் சோமரத்ன—பதில் நீர்ப்பாசன, மின்சக்தி, பெருவீதிகள் அமைச்சர்)
(The Hon. Senerath Somaratne—Acting Minister of Irrigation, Power and Highways)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාස තුනක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

*வினாவை மற்றொரு தினத்தில் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*

*Question ordered to stand down.*

PUBLIC LIBRARY
JAFFNA.
Digitized by Noolaham Foundation
noolaham.org | aavanaham.org

### ගිංතොට එන්. පී. ජී. සුමතිපාල මහතාට හිමි අර්ථ සාධක මුදල්

*திரு. என். பி. ஜீ. சுமதிபாலா, ஜிந்தோட்டை: சேமலாப நிதி வருமதி*

MR. N. P. G. SUMATHIPALA, GINTOTA: PROVIDENT FUND DUES

8. ආචාර්ය ඩබ්ලිව්. දහනායක
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)

කර්මාන්ත සහ විද්‍යා කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ගිංතොට තුනීඇලි කර්මාන්ත ශාලාවේ සේවයෙන් 1969 පෙබරවාරි මස 26 වැනි දින විශ්‍රාම ගත් ගිංතොට ගිංගඟ මාවතේ අංක 53 හි පදිංචි ඇන්. පී. ජී. සුමතිපාල මහතාට ලැබිය යුතු සේවක අර්ථ සාධක අරමුදලේ දායක මුදල් ගෙවීම ප්‍රමාදවීමට හේතු කවරේද? (ආ) මෙය වහාම ගෙවීමට එතුමා පියවර ගන්නේද?

*கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா: (அ) ஜிந்தோட்டை, ஒட்டுப்பலகைத் தொழிற்சாலையிலிருந்து 1969 பெப்ருவரி மாதம் 26 ஆந் தேதி இளைப்பாறிய வரும் ஜிந்தோட்டை, ஜின்கங்க மாவத்தை 53 ஆம் இலக்கத்தைச் சேர்ந்தவருமான திரு. என். பி. ஜீ. சுமதிபாலாவிற்குச் சேர வேண்டிய சேமலாப நிதி உதவுத்தொகை மீளளிப்பு தாமதமாவதேன்? (ஆ) இத் தொகையை உடனடியாக வழங்குவதற்கு ஆவன செய்வாரா?*

asked the Minister of Industries and Scientific Affairs: (*a*) Why is the refund of the provident fund contributions due to Mr. N. P. G. Sumathipala of 53, Ginganga Mawatha, Gintota, who retired from the Plywood Factory, Gintota, on 26th February 1969, being delayed? (*b*) Will he see that payment is made at once?

**ගරු ටී. බී. සුබසිංහ (කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමති)**
*(கௌரவ ரீ. பி. சுபசிங்ஹ—கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் அமைச்சர்)*
(The Hon. T. B. Subasinghe—Minister of Industries and Scientific Affairs)

(අ) 69.6.2 දින පැවති වෛද්‍ය මණ්ඩලයකින් කෙරුණු නිර්දේශයන් අනුව ඇන්. පී. ජී. සුමතිපාල මහතා විශ්‍රාම යවන ලදී. තුනීඇලි සංයුක්ත මණ්ඩලය විසින් අදාල සේවක අර්ථ සාධක අරමුදල් පිළිබඳ ආකෘතියක් 69.6.18 දින කම්කරු කොමසාරිස් යටතේ වූ සේවක අර්ථ සාධක අරමුදල වෙත ඉදිරිපත් කර ඇත. (ආ) සේවක අර්ථසාධක අරමුදල යටතේ වූ ලාභ ප්‍රයෝජන සඳහා කෙරෙන ඉල්ලීම් පිළිබඳව ක්‍රියා කරනු ලබනුයේ කම්කරු කොමසාරිස් භාරයේ පවත්නා සේවක අර්ථ සාධක අරමුදල මගිනි.

### ගාල්ලේ ඩබ්ලිව්. ඒ. උපාසක අප්පු මහතාට හිමි අර්ථ සාධක මුදල්

*திரு. டபிள்யு. ஏ. உபாசக்க அப்பு, காலி: ஊ. சே. நி. வருமதி*

MR. W. A. UPASAKA APPU, GALLE: E. P. F. DUES

10. ආචාර්ය ඩබ්ලිව්. දහනායක
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)

කම්කරු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) ගාල්ලේ බටදූවේ 'විජය නිවසේ' ඩබ්ලිව්. ඒ. උපාසක අප්පු මහතාට හිමි සේවක අර්ථසාධක අරමුදලේ ගෙවීම් රු. 2,167.26 ක් වන අතර [යොමු අංක 1/ජී/209] ඊට අදාල සියළුම ලියකියවිලි නියමිත පරිදි ඉදිරිපත් කොට ගෙවීම සඳහා වූ ඊසිට්පතද යවා මාස තුනක් ගතවූවාට පසු වුවද, එම ගෙවීම් කරනු නොලබන බව, එතුමා දන්නවාද? (ආ) මෙම මුදල වහාම ගෙවීමටත්, ප්‍රමාදය ගැන වගකිව යුතු නිලධාරීන්ට දඬුවම් කිරීමටත් එතුමා වග බලා ගන්නවාද?

*தொழில் அமைச்சரைக் கேட்ட வினா: (அ) காலி, பட்டதூவ விஜய நிவச வாசி திரு. டபிள்யு. ஏ. உபாசக்கு அப்பு என்பவருக்கு உரித்தான ஊ. சே. நிதித் தொகையான ரூபா 2,167.26 (இல. 1/6/209) சகல ஏடுகளையும் முறையாக அனுப்பி வைத்து 3 மாதங்கள் ஆகியும், பற்றுச்சீட்டும் முறைப்படி அனுப்பி வைத்த பின்னரும், இன்னும் இவருக்கு கொடுக்கப்படவில்லை என்பதை அவர் அறிவாரா? (ஆ) கொடுப்பனவை உடனே கொடுப்பதற்கு ஆணையிட்டு, தாமதத்திற்கு பொறுப்பான உத்தியோகத்தர்களை முறைப்படி தண்டிப்பதற்கும் அவர் ஆவன செய்வாரா?*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

asked the Minister of Labour: (a) Is he aware that the E.P.F. dues of Mr. W. A. Upasaka Appu of Wijaya Niwasa, Bataduwa, Galle, amounting to Rs. 2,167.26 (ref. No. 1/G/209) are not being paid to him three months after all documents have been properly forwarded and the receipt for payments also has been duly sent ? (b) Will he see that payment is made at once and the officers concerned in this delay are duly punished ?

**හේමචන්ද්‍ර සිරිසේන මයා. (කම්කරු ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. ஹேமச்சந்திர சிறிசேன—தொழில் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. Hemachandra Sirisena—Parliamentary Secretary to the Minister of Labour)

(අ) සේ.අ.අ. ප්‍රතිලාභ වශයෙන් රු. 2,167.26ක මුදලක් උපාසක අප්පු මහතා වෙත 70.7.31 වැනි දිනදී ගෙවා ඇත. (ආ) ඉහත (අ) අනුව වැඩිදුර කට යුතු අවශ්‍ය නොවේ.

**1966 ජනවාරි 8 වනදා සිද්ධීන් පිළිබඳ වාර්තාව**

*1966 ஜனவரி 8 இல் இடம்பெற்ற சம்பவங்கள் பற்றிய அறிக்கை*

REPORT ON INCIDENTS OF 8TH JANUARY 1966

1. **එම්. තෙන්නකෝන් මයා.** (නිකවැර ටිය—ප්‍රින්ස් ගුණසේකර මයා.—හබරා දුව—වෙනුවට)

*(திரு. எம். தென்னகோன்—நிக்கவரட்டிய திரு. பிறின்ஸ் குணசேக்கர—ஹபருதுவ—சார்பாக)*

(Mr. M. Tennakoon—Nikaweratiya—on behalf of Mr. Prins Gunasekera—Habaraduwa)

අග්‍රාමාත්‍ය, රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු සහ ක්‍රම සම්පාදන හා රැකීරක්ෂා ඇමතිනියගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1966 ජනවාරි 8 වෙනිදා සිදු වූ නීති විරෝධී, ආගම් විරෝධී හා භාෂා විරෝධී ක්‍රියාවන් ගැන පරීක්ෂා කර බලා සකසා ඇති කොමිසමේ වාර්තාව එතුමිය ඉදිරිපත් කරනවාද? (ආ) නො එසේ නම්, ඒ මන්ද?

*பிரதம அமைச்சரும், பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரும் திட்டமிடல், தொழில்வசதி அமைச்சருமானவரைக் கேட்ட வினா: (அ) 1966 ஜனவரி 8 இன் சமய விரோத, மொழி விரோத, சட்ட விரோத நடவடிக்கைகள் பற்றிய ஆணைக்குழுவின் அறிக்கையை, அவர் சமர்ப்பிப்பாரா? (ஆ) இல்லையெனில், ஏன்?*

asked the Prime Minister and Minister of Defence & External Affairs and Minister of Planning & Employment: (a) Will she present to this House the commission's report on the anti-religious, anti-language and illegal actions of 8th January 1966 ? (b) If not, why ?

**ලක්ෂ්මන් ජයකොඩි මයා. (අග්‍රාමාත්‍ය, රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. லக்ஷ்மன் ஜயகொடி—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரும் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. Lakshman Jayakody—Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

(අ) හා (ආ) පහත සඳහන් හේතූන් අනුව එල්. ඩබ්ලිව්. ද සිල්වා කොමිෂන් වාර්තාව මන්ත්‍රී මණ්ඩලයට ඉදිරිපත් කිරීමට අදහස් නොකරනු ලැබේ. (i) මෙම කොමිෂන් සභාව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි හා එහි ප්‍රයෝජනය සඳහා එහි විනයානුකූල බලතල පාවිච්චි කිරීමට උපකාරයක් වශයෙන් විනයානුකූල විමර්ශනයක් සඳහා අවශ්‍ය යෙන්ම සංස්ථාපනය කරන ලද විනිශ්චය සභාවකි. මෙම කොමිෂන් සභාව රජයේ පොදු කායභියන් සඳහා සකස් කරන ලද්දක් නොවේ. (ii) කොමිෂන් සභාව 1966 ජනවාරි මස 8 වන දින ඇතිවූ සිද්ධීන් ගැන පරීක්ෂා කිරීමේ පොදු බලතල සහිත වූවක් නොව පොලිස් නිලධාරීන් තිදෙනෙකු විසින් රාජකාරිය පැහැර හැරීම පිළිබඳ ඇතැම් චෝදනා පරීක්ෂා කිරීමේ ඉතා සීමිත හා පටු බල තල සහිතවූ එකකි. (iii) තමන්ගේ නිදහසට හේතු දැක්වීමේ අවස්ථාව නොලත් පුද්ගලයන් පිළිබඳ බරපතල චෝදනා වාර්තාවෙහි අඩංගුවේ. මේ පුද්ගලයෝ රාජ්‍ය සේවයට හා යුද්ධ හමුදාවට අයත් වූවෝ වෙති. වාර්තාව ප්‍රසිද්ධ කිරීම මෙම පුද්ගලයන්ට අසාධාරණයක් වන්නේය.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එම්. තෙන්නකෝන් මයා.**
(திரு. எம். தென்னகோன்)
(Mr. M. Tennakoon)
ඒ වාර්තාව ඉදිරිපත් නොකිරීම නිසා පොදු මහජන හැඟීම්වලට බාධාවක් වේද?

**ලක්ෂ්මන් ජයකොඩි මයා.**
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
නැත.

## කොස්ගම ලංකා තුනී ලෑලි සංස්ථා වැඩපොල ඉදිරිපිට තනා ඇති නිවාස

## இலங்கை ஒட்டுப்பலகைக் கூட்டுத்தாபனம் : கொஸ்கம வேலைத்தலத்திற்கு எதிரே கட்டப்பட்டுள்ள வீடுகள்

## CEYLON PLYWOODS CORPORATION : HOUSES BUILT OPPOSITE KOSGAMA WORKSITE

7. **බොනී ජයසූරිය මයා.** (අවිස්සාවේල්ල) මල්ලිකා රත්වත්තෙ මිය.—බලන්ගොඩ—වෙනුවට)
(திரு. பொனி ஜயசூரிய—அவிசாவளை—திருமதி மல்லிகா ரத்வத்த—பலாங்கொடை—சார்பாக)
(Mr. Bonnie Jayasuriya—Avissawella—on behalf of Mrs. Mallika Ratwatte—Balangoda)

කර්මාන්ත සහ විද්‍යා කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) 1970 මැයි මස 27 වැනි දිනට පෙර අවිස්සාවේල්ල ඡන්ද කොට්ඨාශයේ කොස්ගම පිහිටි ලංකා තුනී ලෑලි සංස්ථාවේ වැඩපොල ඉදිරිපිට වායු සමීකරණය කරන ලද නිවාස දෙකක් තනා ඇති බවත්; (ii) මෙම නිවාස දෙක වැඩපොලෙහි සේවය කරන ඉංජිනේරුවන්ට කුළියට දී ඇති බවත්; (iii) මෙම නිවාස තැනීමට පාවිච්චි කරන ලද ඇතැම් ගොඩනැගිලි උපකරණ සංස්ථාවේ වැඩපොළෙන් ලබාගත් බවත්, එතුමා දන්නවාද? (ආ) මෙම නිවාස දෙක අයිතිකරු කවරෙක්ද? (ඉ) මෙම කාරණය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා සංස්ථාව සතු උපකරණ පෞද්ගලික පාවිච්චියට ගැනීමට ඉඩදෙන ලද වගකිව යුත්තන්ගේ නම් හෙළිදරව් කිරීමට එතුමා කටයුතු කරනවාද?

கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) 1970, மே மாதம் 27 ஆந் தேதிக்கு முன்னர், அவிசாவளைத் தொகுதியில், கொஸ்கமவிலுள்ள இலங்கை ஒட்டுப்பலகைக் கூட்டுத்தாபன வேலைத் தலத்திற்கு எதிரேயுள்ள காணியில் இரண்டு குளிர்சாதனம் பொருத்தப்பட்ட வீடுகள் கட்டப்பட்டிருக்கின்றன என்பதையும்; (ii) வேலைத்தலத்திற் கடமை பார்க்கும் இரண்டு பொறிஞர்களுக்கு இவை வாடகைக்குக் கொடுக்கப்பட்டிருக்கின்றன என்பதையும்; (iii) இந்த வீடுகளைக் கட்டுவதற்கு சில கட்டடப் பொருட்கள் கூட்டுத்தாபன வேலைத் தலத்திலிருந்து பெற்றுக் கொள்ளப்பட்டன என்பதையும் அவர் அறிவாரா? (ஆ) இந்த இரண்டு வீடுகளினதும் சொந்தக்காரர் யார்? (இ) தனியார் வேலைக்கு கூட்டுத்தாபனப் பொருட்களைக் கொடுப்பதற்குப் பொறுப்பாயிருந்தவர்களை அறியவென இவ்விஷயம் பற்றி விசாரணை நடைபெறச் செய்வாரா?

asked the Minister of Industries and Scientific Affairs: (*a*) Is he aware that (i) two air-conditioned houses have been built on the land opposite the Ceylon Plywoods Corporation worksite at Kosgama in the Avissawella Electorate prior to 27th May 1970; (ii) these two houses are rented out to engineers working at the site; (iii) certain building materials for the construction of these houses were taken from the corporation worksite? (*b*) Who is the owner of these two houses? (*c*) Will he cause an inquiry to be held into this matter and bring to light those responsible for giving out the corporation's materials for private work?

**ගරු සුබසිංහ**
(கௌரவ சுபசிங்ஹ)
(The Hon. Subasinghe)
(අ) (i) ඔව්. (ii) ඔව්. (iii) ලංකා තුනී ලෑලී සංයුක්ත මණ්ඩලයට අයත් කොස්ගම ඉරුම් මෝලෙන් රු. 6967 ක් වටිනා ඉරන ලද ලී විකුණා ඇත. (ආ) මෙම ගෙවල් දෙකේ අයිතිකරු කිරිල්ලපොන මාවතේ අංක 84 හි පදිංචි කුසුමා ගුණවර්ධන මහත්මිය යි. (ඉ) පැන නොනගී.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## අක්කරෙයිපත්තු ගම් සභාව : එකතුවන මුදල්

*அக்கரைப்பற்று கி. ச. பண வசூல்*

**VILLAGE COUNCIL, AKKARAIPATTU : CASH COLLECTIONS**

9. ආචාර්ය ඩබ්ලිව්. දහනායක (එම්. ඒ. අබ්දුල් මජීඩ් මයා.—පොතුවිල්—වෙනුවට)

(கலாநிதி டபிள்யு. தஹநாயக்க—ஜனாப் எம். ஏ. அப்துல் மஜீது—பொத்துவில்—சார்பாக)

(Dr. W. Dahanayake—on behalf of Mr. M. A. Abdul Majeed—Pottuvil)

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : එකතුවන මුදල්, නියමිත පරිදි කච්චේරියේ තැන්පත් කිරීමට, අක්කරෙයිපත්තු ගම්කාර්ය සභාවේ සභාපතිවරයා හය මසක් පමණ අපොහොසත් වී ඇත්තේ මන් ද?

*பொது நிர்வாகம், உள்ளூராட்சி, உள்நாட்டு அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா : அக்கரைப்பற்று கி. ச. தலைவர், கி. ச. விற் சேர்ந்த பணத்தை சுமார் 6 மாதங்களாக நியமப்படி கச்சேரியிற் கட்டத்தவறியதேன்?*

asked the Minister of Public Administration, Local Government and Home Affairs: Why has the Chairman, V.C., Akkaraipattu, failed to deposit the cash collection made at the kachcheri as required for about 6 months?

නීල් ද අල්විස් මයා. (රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)

(திரு. நீல் த அல்விஸ்—பொது நிர்வாகம், உள்ளூராட்சி, உள்நாட்டு அலுவல்கள் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)

(Mr. Neal de Alwis—Parliamentary Secretary to the Minister of Public Administration, Local Government and Home Affairs)

There are 3 village councils by the name of Akkaraipattu, i.e. Akkaraipattu Central, Akkaraipattu South and Akkaraipattu North. This Question appears to refer to Akkaraipattu South. Action under Section 54 of the Village Councils Ordinance is contemplated for failure to deposit the V. C. collection at the kachcheri within the prescribed period, and a letter has been sent to the Chairman of the Akkaraipattu South V. C. on 11.9.70. On receipt of his reply, further action will be taken.



# පණත් කෙටුම්පත් පිළිගැන්වීම

*சமர்ப்பிக்கப்பட்ட மசோதாக்கள்*

## BILLS PRESENTED

### ලංකා (ආණ්ඩු ක්‍රම සහ ස්වාධීනතා) සංශෝධන පනත් කෙටුම්පත

*இலங்கை (அரசமைப்பும் சுதந்திரமும்) (திருத்தம்) மசோதா*

**CEYLON (CONSTITUTION AND INDEPENDENCE) AMENDMENT BILL**

"උත්තර මන්ත්‍රී මණ්ඩලය නැති කිරීමේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ පත් කළ මන්ත්‍රීවරුන්ගේ ගණන හයේ සිට අට දක්වා වැඩි කිරීමේ කාර්‍ය සඳහා 1946 ලංකා (ආණ්ඩු ක්‍රම) රාජසභා ආඥාව සංශෝධනය කිරීම පිණිස ද 1947 ලංකා (ස්වාධීනතා) රාජසභා ආඥාවෙහි ආනුෂංගික සංශෝධනයක් කිරීම සඳහා ද මේ පනතේ විධිවිධානවලට යටත් ව වෙනස් ප්‍රඥප්ති කියවා තේරුම් ගැනීමට හැකිවීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි."

පිළිගන්වන ලද්දේ වැවිලි කර්මාන්ත ඇමති සහ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා කටයුතු ඇමති ගරු ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා විසිනි. 1970 ඔක්තෝබර් 23 වන සිකුරාදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදී.

*தோட்டத் தொழில், அரசியலமைப்பு அலுவல்கள் அமைச்சர் கௌரவ கலாநிதி கொல்வின் ஆர். த சில்வா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1970 ஒக்ரோபர் 23, வெள்ளிக்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Dr. Colvin R. de Silva, Minister of Plantation Industry and Minister of Constitutional Affairs; to be read a Second time upon Friday, 23rd October 1970, and to be printed.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු

சபை அலுவல்

BUSINESS OF THE HOUSE

**ගරු ටී. බී. ඉලංගරත්න (විදේශීය හා දේශීය වෙළඳ ඇමති සහ වැඩ බලන සභා නායක)**

*(கௌரவ ரி. பி. இலங்கரத்ன—வெளி நாட்டு, உள்நாட்டு வர்த்தக அமைச்சர்)*

(The Hon. T. B. Ilangaratne—Minister of Foreign and Internal Trade and Acting Leader of the House)

මෙම යෝජනාව මම ඉදිරිපත් කරනවා :

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 1 සිට 6 දක්වා ඇති විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 8 දරණ ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතුය."

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## මන්ත්‍රී මණ්ඩලයේ රැස්වීම්

சபை அமர்வு

SITTINGS OF THE HOUSE

**ගරු ටී. බී. ඉලංගරත්න**

*(கௌரவ ரி. பி. இலங்கரத்ன)*

(The Hon. T. B. Ilangaratne)

මෙම යෝජනාව මම ඉදිරිපත් කරනවා :

"අද දින විසිර යෑමේදී මන්ත්‍රී මණ්ඩලය 1970 ඔක්තෝබර් 23 වැනි සිකුරාදා අ. භා. 2 වන තෙක් කල් තැබිය යුතුය. එදින රැස්වීම පැවැත්වීමේ කාලවේලා පෝය දින සිට යෙදෙන දෙවන දිනයක මෙන් විය යුතුය."

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

## ආහාර පාලන නියෝග

உணவுக் கட்டுப்பாட்டுக் கட்டளைகள்

FOOD CONTROL ORDERS

**ගරු ටී. බී. ඉලංගරත්න**

*(கௌரவ ரி. பி. இலங்கரத்ன)*

(The Hon. T. B. Ilangaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම යෝජනාව මම ඉදිරිපත් කරනවා :

"(171 වන අධිකාරය වන) ආහාර පාලන පණතේ 4 (1) (i) වන වගන්තිය යටතේ වැඩ බලන විදේශීය හා දේශීය වෙළඳ ඇමති විසින් පනවනු ලැබ, 1970 සැප්තැම්බර් මස 11 වැනි දින අංක 14,922/6 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව, 1970.9.25 වැනි දින ඉදිරිපත් කරන ලද අංක 296 දරණ ආහාර පාලන නියෝගය අනුමත කළ යුතුය."

මේවා සාමාන්‍ය වශයෙන් ආහාර දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරනු ලබන නියෝගයි. රතුලූනු කිසියම් ප්‍රමාණයක් යාපනේ අර්ධද්වීපයට ගෙන යෑම තහනම් කිරීමටයි, මෙම නියෝගය ඉදිරිපත් කර තිබෙන්නෙ. මෙය කලින් ගැසට් පත්‍රයේ පළ කර තිබෙනවා. මන්ත්‍රී මණ්ඩලයේ සම්මතිය ගැනීම සඳහායි දැන් ඉදිරිපත් කර තිබෙන්නෙ.

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

**ගරු ටී. බී. ඉලංගරත්න**

*(கௌரவ ரி. பி. இலங்கரத்ன)*

(The Hon. T. B. Ilangaratne)

මෙම යෝජනාව මම ඉදිරිපත් කරනවා :

"(171 වන අධිකාරය වන) ආහාර පාලන පණතේ 4 (1) (i) වන වගන්තිය යටතේ වැඩ බලන විදේශීය හා දේශීය වෙළඳ ඇමති විසින් පනවනු ලැබ, 1970 සැප්තැම්බර් මස 11 වැනි දින අංක 14,922/6 දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව, 1970.9.25 වැනි දින ඉදිරිපත් කරන ලද අංක 297 දරණ ආහාර පාලන නියෝගය අනුමත කළ යුතුය."

මෙම නියෝගයද රතුලූනු සම්බන්ධවයි. රතුලූනු රාත්තල් 7කට වඩා වැඩි ප්‍රමාණයක් මේ රටේ කිසි ස්ථානයකින් ගෙන යෑම තහනම් කිරීමටයි මෙය ඉදිරිපත් කර තිබෙන්නෙ.

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Question put, and agreed to.*

**ගරු ටී. බී. ඉලංගරත්න**

*(கௌரவ ரி. பி. இலங்கரத்ன)*

(The Hon. T. B. Ilangaratne)

මෙම යෝජනාව මම ඉදිරිපත් කරනවා :

"(171 වන අධිකාරය වන) ආහාර පාලන පණතේ 4 (1) (i) වන වගන්තිය යටතේ වැඩ බලන විදේශීය හා දේශීය වෙළඳ ඇමති විසින් පනවනු ලැබ, 1970 සැප්තැම්බර් මස 11 වැනි දින අංක 14,922/6 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන ලදුව, 1970.9.25 වැනි දින ඉදිරිපත් කරන ලද අංක 298 දරණ ආහාර පාලන නියෝගය අනුමත කළ යුතුය."

බිත්තර වී එහා මෙහා ගෙන යෑමේදී අවසර පත්‍රයක් නැතිව ගෙන යෑම තහනම් කිරීමටයි මෙම නියෝගය ඉදිරිපත් කර තිබෙන්නෙ.

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු ටී. බී. ඉලංගරත්න**
*(கௌரவ ரி. பி. இலங்கரத்ன)*
(The Hon. T. B. Ilangaratne)

මෙම යෝජනාව මම ඉදිරිපත් කරනවා :

"(171 වන අධිකාරය වන) ආහාර පාලන පණතේ 4 (1) (iv) වන වගන්තිය යටතේ වැඩ බලන විදේශීය හා දේශීය වෙළඳ ඇමති විසින් පනවනු ලැබ, 1970 සැප්තැම්බර් මස 11 වැනි දින අංක 14,922/6 දරණ ලංකාණ්ඩුවේ අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලදුව, 1970.9.25 වැනි දින ඉදිරිපත් කරන ලද අංක 299 දරණ ආහාර පාලන නියෝගය අනුමත කළ යුතුය."

හාල්, වී, තිරිඟු, තිරිඟු පිටි හෝ කුරක්කන් ආදිය අවසර පත්‍රයක් නොමැතිව ලංකාවේ වරායවලින් පිටමං කිරීම තහනම් කිරීමටයි මෙම නියෝගය ඉදිරිපත් කර තිබෙන්නෙ.

**ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.**
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය: වාර්ෂික වාර්තා (1963/64, 1964/65 සහ 1965/66)

*கிழக்கிலங்கைக் கடதாசி ஆலைக் கூட்டுத் தாபனம் : வருடாந்த அறிக்கைகள் (1963/64, 1964/65, 1965/66)*

## EASTERN PAPER MILLS CORPORATION : ANNUAL REPORTS (1963-64, 1964-65 AND 1965-66)

**ගරු සුබසිංහ**
*(கௌரவ சுபசிங்ஹ)*
(The Hon. Subasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම යෝජනාව මා ඉදිරිපත් කරනවා :

"1957 අංක 49 දරණ රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පණතේ 30 (2) වැනි වගන්තිය යටතේ 1970. 9. 25 වැනි දින ඉදිරිපත් කරණ ලද 1963-64, 1964-65 සහ 1965-66 සංයුක්ත මණ්ඩල වර්ෂ සඳහා ගිණුම් පරීක්ෂණ වාර්තා, ඔඩිටර් ජනරාල්ගේ නිරීක්ෂණ, වෙළඳාම් හා ලාභාලාභ ගිණුම් සහ ශේෂ පත්‍ර ඇතුලත් නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තා අනුමත කළ යුතුය."

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදි.**
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

අ. භා. 2.20

**ජේ. ඩී. වීරසේකර මයා. (කොත්මලේ)**
*(திரு. ஜே. டி. வீரசேகர—கொத்மலை)*
(Mr. J. D. Weerasekera—Kotmale)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාව ගැන වචන ස්වල්පයක් කථා කරන්නට මා බලාපොරොත්තු වෙනවා. අද අප ඉදිරිපිට තබා තිබෙන්නේ 1963-64 වර්ෂය සඳහා වූ වාර්තාවත්, 1964-65 වර්ෂය සඳහා වූ වාර්තාවත්, 1965-66 වර්ෂය සඳහා වූ වාර්තාවත් බව තමුන්නාන්සේ දන්නවා. මේ තරම් කාලයක් ප්‍රමාද වී මේ වාර්තා ඉදිරිපත් කිරීම සතුටුදායක කාරණයක් නොවෙයි. මේ සම්බන්ධයෙන් මේ ගරු ඇමතිතුමාට දොස් කියන්නට අපට පුළුවන්කමක් නැහැ. ඇත්තෙන්ම මේ සම්බන්ධයෙන් දොස් කියන්නට අපට සිදු වී තිබෙන්නේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාටයි. අවුරුදු හතක් ප්‍රමාද වී මෙවැනි වාර්තාවක් සාකච්ඡාවට භාජන කිරීමෙන් ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැහැ. පසුගිය ආණ්ඩුව මේ කාරණයෙහිලා සම්පූර්ණයෙන්ම චෝදනා ලබනවා.

**ජේ. ආර්. ජයවර්ධන මයා. (දකුණු කොළඹ පළමුවන)**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன—கொழும்பு தெற்கு முதலாம் அங்கத்தவர்)*
(Mr. J. R. Jayewardene—First Colombo South)

1963-64 සහ 1964-65 වාර්තා සම්බන්ධයෙන් වැරදිකාරයන් කවුද? 1965-66

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජේ. ආර්. ජයවර්ධන මයා.]

වාර්තාව ප්‍රමාදවීම සම්බන්ධයෙන් අපි වැරදිකාරයෝ. අනෙක් වාර්තා දෙක ප්‍රමාද වීම සම්බන්ධයෙන් තමුන්නාන්සේලා වැරදිකාරයෝ.

**ජේ. ඩී. වීරසේකර මයා.**
*(திரு. ஜே. டீ. வீரசேகரா)*
(Mr. J. D. Weerasekera)

කෙසේ වුණත් මෙය සතුටුදායක කාරණයක් නොවෙයි. පෞද්ගලික අංශයේ මෙන් වර්ෂය අවසානයේදී වාර්තා සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස මා වාර්තමාන ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. පෞද්ගලික අංශයේත් ආණ්ඩුවේත් කටයුතුවල වෙනසක් තිබෙන්නට හොඳ නැහැ. යම් වර්ෂයක මාර්තු අප්‍රේල් මාස වන විට ඒ කලින් වර්ෂයේ වාර්තාව ඉදිරිපත් කරන්නට ඕනෑ. අවුරුදු හතක් කල් පසු වී යම් වාර්තාවක් ගැන සාකච්ඡා කිරීමෙන් ප්‍රයෝජනයක් නැහැ. අවුරුදු හතකට පසු වරදවල් සොයා ගැනීමෙන් වැඩක් නැහැ.

කෙසේ වුවත් නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය ගැන අප සතුටු වන්නට ඕනෑ. 1956 දී ශ්‍රීමත් බණ්ඩාරනායක අගමැතිතුමාගේ කාලයේදී වාලච්චේනෙයි කඩදාසි කම්හල රජයට පවරාගෙන රජයේ කඩදාසි කම්හලක් ලෙස පවත්වාගෙන යන ලදී. ආරම්භයේදී එතරම් සාර්ථක නොවූවත් කැනඩා රජයේ සැන්ඩ්වේල් උපදේශක සමාගමේ උපදෙස් පිට මෙහි දියුණුව ආරම්භ වූයේ 1958 දීයි.

සැන්ඩ්වේල් සමාගමට ස්තුති වන්නට, 1960 දී ඇති කරන ලද පුළුල් කිරීමේ වැඩ පිළිවෙළ අනුව වර්ෂයකට කඩදාසි ටොන් 9,000 ක් නිපදවීමේ ඉලක්කය කරා වාලච්චේනෙයි කම්හල පිය නැඟුවා. 1965-66 වර්ෂය සඳහා වූ වාර්තාවේ 9 වැනි පිටුවේ මෙම ඉලක්කය කරා, නිපදවීමේ ප්‍රමාණය දියුණු වූ අයුරු පෙන්වා තිබෙනවා.

| | | | ටොන් |
|---|---|---|---|
| 1956-57 | ... | ... | 567 |
| 1957-58 | ... | ... | 1,756 |
| 1958-59 | ... | ... | 1,305 |
| 1959-60 | ... | ... | 4,574 |
| 1960-61 | ... | ... | 4,669 |
| 1961-62 | ... | ... | 4,105 |
| 1962-63 | ... | ... | 5,127 |
| 1963-64 | ... | ... | 5,790 |
| 1964-65 | ... | ... | 6,610 |
| 1965-66 | ... | ... | 7,950 |

වර්ෂයකට කඩදාසි ටොන් 9,000 ක් නිපදවීමේ ඉලක්කය සාර්ථක කර ගැනීමේ සංවර්ධන වැඩ පිළිවෙළ සම්පූර්ණ කර ගැනීමට 1960 සිට 1965 දක්වා වූ අවුරුදු පහේ කාලය ගත වී තිබෙනවා. මේ නිසා බලාපොරොත්තු වූ ඉලක්කය සම්පූර්ණයෙන් නිපදවීමට හැකියාව ඇත්තේ 1966 වර්ෂයේ සිටය. දිවයිනේ පැවති කඩදාසි හිඟයට පිළියම් යෙදීම සඳහා කඩදාසි කම්හල සංයුක්ත මණ්ඩලයක් බවට පත් කොට සියලුම කඩදාසි බෙදා හැරීම පිණිස ගෙන්වීම සඳහා 1964 නැගෙනහිර කඩදාසි සංයුක්ත මණ්ඩලය ඇති කරන ලදී. එහෙත් රටේ සියලුම අවශ්‍යතාවයන්ට සරිලන කඩදාසි මෙහි නිපදවීමට නොහැකි නිසා පහත සඳහන් අයුරින් කඩදාසි ආනයනය කිරීම සංයුක්ත මණ්ඩලය විසින් කරනු ලැබේ.

(1) දිවයිනේ පුවත් පත් සඳහා අවශ්‍ය කඩදාසි, ආනයන පාලක තැනගේ විශේෂ අවසරය පරිදි ගෙන්වීම. (2) කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශයේ සංවර්ධන අංශයෙන් ලැබෙන අනුමැතිය අනුව විදේශ විනිමය පිළිගත් කර්මාන්තවලට අවශ්‍ය කඩදාසි වර්ග තමන්ගේ ආයතනයන් වෙත පවරා දීම. (3) ආනයන පාලක තැනගේ පාලනය යටතේ දිවයිනේ පාරිභෝගිකයන්ට අවශ්‍ය කඩදාසි සංයුක්ත මණ්ඩලයෙන් පමණක් ගෙන්වා බෙදා දීම. (4) ඒ ඒ ආයතන හා පිළිගත් කර්මාන්ත ආයතනවල හැරෙන්නට ඉතිරි ස්ථානයන්ගේ කඩදාසි ගබඩාකර බෙදා හැරීම සංයුක්ත මණ්ඩලයේ වගකීම පිට පමණක් කිරීම.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කඩදාසි නිපදවීම සඳහා අවශ්‍ය පල්ප් සාදා ගැනීම පිණිස උවමනා අමු ද්‍රව්‍ය අප රටින්ම පහසුවෙන් සොයා ගන්නට පුළුවනි. හණ, ජූට්, තණ, ගොයම්, තිරිඟු, උක්දඬු, උණබම්බු, කෙසෙල්, කපු, පොල්, තල් ගෙඩි ආදී ද්‍රව්‍ය අප රටින්ම ලබා ගන්නට පුළුවනි. මේ අනුව කල්පනා කර බලන විට, මෙම කර්මාන්තය ඉතා සාර්ථක ලෙස පවත්වා ගෙන යන්නට පුළුවන් බව මතක් කරන්න කැමතියි.

මෙම සංයුක්ත මණ්ඩලය මගින් නිකුත් කරන ලද 1965-66 වාර්ෂික වාර්තාවේ තිබෙනවා, පිදුරු එකතු කිරීමේ මධ්‍යස්ථාන හයක් රජය මගින් ආරම්භ කර ඇති බව. ඒ ස්ථානවලින් වර්ෂයක් තුළදී පිදුරු ටොන් අට දහසක් පමණ එකතු කර තිබෙනවා. මේ කාරණය ගැන නම් අපට කිසිසේත් සතුටු වෙන්න බැහැ. මන්ද? බොහෝ පළාත්වල ගොයම් කපා අවසන් වුණාට පස්සෙ, නැවතත් ගොවිතැන් වැඩ කරගෙන යන්න ඕනෑ නිසා පිදුරු ආදිය පුළුස්සා දමනවා. කර්මාන්තයක් සඳහා ප්‍රයෝජනයට ගත හැකි අමු ද්‍රව්‍යයක් මෙලෙස විනාශ කර දැමීමට සිදු වීම අපරාධයක්. එම නිසා අමු ද්‍රව්‍ය එකතු කරන මධ්‍යස්ථාන වැඩි වැඩියෙන් රට පුරා පිහිටුවිය යුතු අතර ඒවා "පල්ප්" වශයෙන් සකස් කිරීමට අවශ්‍ය "ප්‍රෙසිං මැෂින්ස්" ගොවියන්ට ලබා දී සුළු කර්මාන්තයක් වශයෙන් පවත්වාගෙන යන්නට ධෛයයි දිය යුතුයි. මේ අන්දමට අපතේ යන විශාල අමු ද්‍රව්‍ය ප්‍රමාණයකින් ප්‍රයෝජනයක් ගත හැකි අතර එයින් ගොවියාටද සෙතක් සැලසෙනවා. කෙසෙල් කැනක් කපා ගැනීමෙන් පසුව ඉතිරි කොටස් විනාශ කර දමනවා. ප්‍රෙසිං මැෂින්ස් උපයෝගි කර ගෙන මේවා සකස් කොට කඩදාසි කර්මාන්තශාලාවට ගෙන්වා ගැනීමට වැඩ පිළිවෙළක් සකස් කර දීමට හැකි වුණොත් එමගින් සැහෙන සංඛ්‍යාවකට රැකී රක්ෂා ලබාගැනීමේ මාර්ගයක් ඇති වෙනවා පමණක් නොවෙයි, කඩදාසි කර්මාන්තයෙන් වැඩි වැඩියෙන් ආදායම් ලබා ගැනීමට අවකාශ සැලසෙනවා.

එපමණක් නොවෙයි, ඉලුක් වවන්න යාමෙන් සහ පිදුරු ලබා ගැනීමේ අදහසින් ගොයම් වගා කරන්න යාමෙන් විශාල අලාභ විඳින්නට සිදු වී තිබෙනවා. 1965-66 වර්ෂය තුළදී පමණක් කුඹුරු වගාවෙන් රුපියල් 26,752 ක් පාඩු විඳින්නට සිදු වී තිබෙන අතර ඉලුක් වගාවෙන් රුපියල් 19,212 ක් පාඩු විඳින්නට සිදු වී තිබෙනවා. ඉලුක් වගාව සඳහා මුදල් වැය කරන නමුත් උඩරට ප්‍රදේශවල ඉබේ වැවෙන ඉලුක් විනාශ කර දමන බව අප දන්නවා. එම නිසා, ඉලුක් වැවීම රජය මගින් කරන්නේ නැතුව, ඒ කටයුත්ත වෙනත් උදවියට පවරන්න. විනාශ වී යන අමු ද්‍රව්‍ය එකතු කිරීමට වැඩ පිළිවෙළක් සකස් කළොත් දැනට විවිධ බෝග වර්ග වගා කිරීම සඳහා යන වියදම නතර කර ගත හැකි වන අතර රැකීරක්ෂා ප්‍රශ්න යත් තරමක් දුරට විසඳන්නට පුළුවන් බව මා විශ්වාස කරනවා. මෙම කාරණා ගැන ඉතා සැලකිල්ලෙන් කල්පනා කර බලා ස්ථිර වැඩ පිළිවෙළක් අනුගමනය කිරීමෙන් මෙම කර්මාන්තය දියුණු අන්දමින් පවත්වාගෙන යන්නට පුළුවනි. ගාල්ලේ සිමෙන්ති කර්මාන්ත ශාලාවට සිමෙන්ති කැට ගෙනැවිත් එහිදී කුඩු කර පැකට් කරනවා. මේ කර්මාන්ත ශාලාවට අමු ද්‍රව්‍යත් පහසුවෙන් ගෙන්වා ගන්නට පුළුවන් නිසා ඒවා කර්මාන්ත ශාලාවට ගෙන්වා ගෙන කර්මාන්ත ශාලාවෙනුත්, ඒ අමු ද්‍රව්‍යවලිනුත් නියම ප්‍රයෝජනය ගන්නට වැඩ කරන්නට ඕනෑ.

ලංකාවේ වර්ෂයකට කඩදාසි ටොන් 9,000 ක් නිපදවුවත් එයින් පිරිමැසෙන්නේ ලංකාවේ අවශ්‍යතාවෙන් සියයට 25ක් පමණයි. අවශ්‍ය කඩදාසි වර්ගවලින් සියයට 75 ක් තවමත් ගෙන්වා ගන්නේ පිට රටවලිනුයි. තවත් කඩදාසි කර්මාන්ත ශාලාවක් ඇඹිලිපිටියේ පිහිටුවීමට කැබිනට් මණ්ඩලය තීරණය කර තිබෙන බව අද පුවත් පත් මගින් දැන ගන්නට ලැබුණා. එය සතුටුදායක ආරංචියක්. දැනට පිට රටින් ගෙන්වන සියයට 75ක් පමණ වූ කඩදාසි වර්ගත් මෙහිම නිපදවීමෙන් අපට අවශ්‍ය නානා කඩදාසි වර්ග හැම එකක්ම සම්පූර්ණයෙන් මෙහිම නිෂ්පාදනය කිරීමේ බලාපොරොත්තුව සාර්ථක වේවා යි මා ප්‍රාර්ථනා කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ජේ. ඩී. වීරසේකර මයා.]

සාමාන්‍ය ජනතාවගේ ජීවන වියදම අඩු කිරීමේ අදහසින් යම් යම් දේවල මිළ පාලනය කිරීමට රජය කටයුතු කිරීම ගැනත් අප සන්තෝෂ වෙනවා. 1970 සැප්තැම්බර් 25 වැනි දින අංක 14,925 දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කර තිබෙනවා, දන්තාලේප, බයිසිකල් ටයර්, බයිසිකල් ටියුබ්, විදුලිපන්දම් බැටරි, ට්‍රාන්සිස්ටර් බැටරි, කුඩ ආදී දේවල මිළ පාලනය කර තිබෙනවාය කියා. එහෙත් මීටත් වඩා සාමාන්‍ය ජනතාව පරිහරණය කරන දේවල් තිබෙනවා. දන්තාලේප වර්ග පාවිච්චි කරන්නේ ලංකා ජනගහණයෙන් සියයට 17 ක් නැත්නම් 18 ක් පමණ වන පිරිසක් පමණයි. එහෙත් සබන් නම් සෑම කෙනකුම පාහේ පාවිච්චි කරනවා. ඒ හැරෙන්නට මේවායේ මිළ පාලනය කෙරෙනවාත් සමඟම වෙළෙන්දන් ඒ බඩු වර්ග හංගා තිබෙනවා. මෙසේ උන්හිටි ගමන් මිළ පාලනය කරන්නේ නැතිව අසුවල් දින සිට අසුවල් බඩුවල මිළ මේ විධියට පාලනය කරනවාය යි කල් ඇතිව දැනුම් දෙනවා නම් සුළු වෙළෙන්දන්ටත්, සාමාන්‍ය මහ ජනතාවටත් එයින් ලොකු යහපතක් සැලසෙනවා. හදිසියේ මිළ පාලනය කරනවාත් සමගම විශාල තොග වෙළඳුන් තමන්ගේ බඩු තොග හංගන නිසා සුළු වෙළෙන්දන්ට පවා ඒවා ලබා ගන්නට බැරි වෙනවා. එවිට එතෙක් සුළු ලාභයක් ඇතිව හෝ ඒ ද්‍රව්‍ය අලෙවි කිරීමෙන් යැපුණු සුළු වෙළෙන්දන්ට මරු පහරක් වැදෙනවා. එම බඩු ලබා ගන්නට බැරි වීමෙන් සාමාන්‍ය මහ ජනතාවට විඳින්නට සිදු වන හිරිහැර ගැන මා අමුතුවෙන් කිව යුතු නැහැ. දැන් කුඩ, දන්තාලේප ආදිය සොයා ගන්නට බොහොම අමාරුයි. එහෙත් මෙවැනි දේවල් නිෂ්පාදනය කරන, පිටරටින් ගෙන්වන තොග වෙළෙඳුන් අති විශාල ලාභයක් ගන්නවා. එම නිසා මෙවැනි ද්‍රව්‍යයක මිළ පාලනය කරනවා නම් පාලන මිළට පාරිභෝගිකයින්ට ඒ බඩු ලබා ගැනීමට පුළුවන් වන සේ, තමන් එතෙක් ලැබූ අධික ලාභය තරමක් අඩු කර සාමාන්‍ය වෙළෙඳුන්ට බඩු විකුණන ලෙස එවැනි තොග වෙළෙඳුන්ට රජය බල කරන්නට ඕනෑ. පසුගිය කාලයේදී "ලීවර් බ්‍රදර්ස්ලා" ඔවුන්ගේ සබන් වර්ගවල මිළ වැඩි කර වැඩියෙන් ලාභ ගැනීමේ වැඩ පිළිවෙළක් යෙදුවා. එවැනි මහ වෙළෙඳුන් ලවා මිළ අඩු කරවන්නේ නැතිව මිළ පාලනය කරන බවට ගැසට් පත්‍රවල දැන්වීම් පළ කිරීමෙන් වන්නේ මහජනතාව පෙරට වඩා දුෂ්කරතාවලට ඇද වැටීමයි. එම නිසා ඒ ගැන විශේෂ අවධානය යොමු කර විධිමත් වැඩ පිළිවෙළක් ඇති කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ඒ හැරෙන්නට සාමාන්‍ය දුප්පත් මිනිසුන් දන්තාලේප වෙනුවට පාවිච්චි කරන්නේ අඟුරු, ලුණු, දැහැටි ආදිය යි.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)
ඔවා මේ යෝජනාවට අදාළ නැහැ.

**ජේ. ඩී. වීරසේකර මයා.**
*(திரு. ஜே. டீ. வீரசேகர)*
(Mr. J. D. Weerasekera)
කර්මාන්තවලට අදාළ වන නිසයි මා කියන්නේ. අඩුපාඩුකම් හරි ගස්සා ගන්න අදහසින් මා මේ කරුණු ඉදිරිපත් කරන්නේ අපේ ඇමතිතුමාට නිසා විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා ටිකක් නිශ්ශබ්දව සිටිනවා නම් හොඳයි. මෙවැනි භාණ්ඩවල මිළ පාලනය කරන විට මහජනයාට හිරිහැර නොවන විධියට, මහජනයා තවත් අමාරුවේ නොවැටෙන විධියට ඒ කට යුත්ත කරන්නට ඕනෑ.

ජීවන වියදම අඩු කිරීමට අපි සෑම උත්සාහයක්ම දරන්න ඕනෑ. කමිසවල මිළ ගැන බලන්න. ඒ ප්‍රශ්නය අදාළ වෙන්නෙ කර්මාන්ත අමාත්‍යාංශයටයි. යාරය රු. 2 ට වැඩි රෙදි ගෙන්වීම තහනම් කර තිබුණත් කමිසයක මිළ කීයද? රු. 11 කට, 12 කට අඩුවෙන් අඳින්නට පුළුවන් කමිසයක් මිළ දී ගන්නට බැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
What is the relevancy of this ?

**ජේ. ඩී. වීරසේකර මයා.**
*(திரு. ஜே. டீ. வீரசேகர)*
(Mr. J. D. Weerasekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත සංයුක්ත මණ්ඩලය ගැන කථා කරන විට මේ ඔක්කොම අදාළයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
The hon. Member is criticizing a Price Control Order.

**ජේ. ඩී. වීරසේකර මයා.**
*(திரு. ஜே. டீ. வீரசேகர)*
(Mr. J. D. Weerasekera)
නැහැ. මම කියන්නේ—

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)
He is speaking on the wrong item.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
Please speak on the Motion before the House.

**ජේ. ඩී. වීරසේකර මයා.**
*(திரு. ஜே. டீ. வீரசேகர)*
(Mr. J. D. Weerasekera)
එහෙම නම් නැගෙනහිර කඩදාසි සංයුක්ත මණ්ඩලය දැනට වඩා සාර්ථක ලෙස කරගෙන යන ලෙස මා ඇමතිතුමා ගෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 2.37

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කියන්ට තිබෙන කාරණා මේවයි: 1956 සිට අද දක්වා නැගෙනහිර කඩදාසි සංයුක්ත මණ්ඩලයේ වැඩ කටයුතු සතුටුදායක අන්දමට ගෙන ගොස් තිබෙන නමුත් ඒ මගින් රටට අවශ්‍ය අන්දමේ පළල් වැඩ පිළිවෙළෙක් ගෙන ගොස් නැහැ. මේ කම්හලෙන් ලැබෙන්නේ ලංකාවට අවශ්‍ය කඩදාසි ප්‍රමාණයෙන් සියයට 20 ක් පමණයි. අනික් සියයට 80 විදේශ විනිමය වියදම් කරමින් ගෙන්වන්ට ඕනෑ. එහෙත් ලංකාවේ විතර කඩදාසි නිෂ්පාදනයට අවශ්‍ය අමු ද්‍රව්‍ය තිබෙන රටක් ලෝකයේ තවත් නැහැයි කියා මා කල්පනා කරනවා.

විශාල වශයෙන් අපේ විනිමය ඇදී යන කඩදාසි වර්ගයක් තමයි, ප්‍රවෘත්ති පත්‍ර මුද්‍රණය කිරීම සඳහා පාවිච්චි කරන පත්‍ර කඩදාසි. විනිමය අමාරුකම් නිසා මෑතක සිට පත්‍ර කඩදාසි ගෙන්වීම අඩු කර තිබෙනවා. ඒක කනගාටුදායක කාරණයක්. අදහස් ප්‍රසිද්ධ වීමට ප්‍රවෘත්ති පත්‍ර වැඩි වුණ තරමට හොඳ නිසා පත්‍ර කඩදාසි පුළුවන් තරම් ගෙන්වන්නට ඕනෑ. දැන් ප්‍රවෘත්ති පත්‍රවල පිටු ගණන අඩු කරන්ට සිදු වී තිබෙනවා. පත්‍රවල පිටු අඩු කිරීම හොඳ දෙයක් නොවෙයි. එහෙත් විනිමය අමාරුකම් නිසා එසේ කරන්ට සිදු වී තිබෙන බව මා දන්නවා. කෙසේ වෙතත් මෙහි නියම වරද තිබෙන්නේ පසුගිය අවුරුදු කිහිපයේදී නැගෙනහිර කඩදාසි සංයුක්ත මණ්ඩලය ගෙන ගිය වැඩ පිළිවෙළෙයි.

1963 දියි—දැනට අවුරුදු 7 කට උඩ දීයි—පත්‍ර කඩදාසි නිපදවීමේ කම්හලක් මේ රටේ ආරම්භ කිරීමට මුල් පියවර ගන්ට යෙදුණේ. 1963 මාර්තු මාසයේදී ජර්මන් සමූහාණ්ඩු ජන රජයේ විශේෂඥයන් කණ්ඩායමක් ලංකාවට පැමිණ පත්‍ර කඩදාසි කම්හලක් මේ රටේ පිහිටුවීමේ යෝග්‍යතාව ගැන පරීක්ෂණ පැවැත්තුවා. දැන් අවුරුදු 7 ක් ගත වී ඇති නමුත් යෝජිත පත්‍ර කඩදාසි කම්හල අහසේ තිබෙන මාළිගාවක් බවට පත් වී තිබෙනවා. 1963 සිට සංයුක්ත මණ්ඩලයේ හැම වාර්තාවකම මේ කාරණය ගැන සඳහන් වන්නේ කුමක් දැයි මා සොයා බැලුවා. 1964 වාර්තාවේ කියා තිබෙනවා, මේ කාරණය ගැන තව දුරටත් සෝදිසි කරගෙන යනවා කියා. 1965-66 වාර්තාවේත් සඳහන් වන්නේ පත්‍ර මුද්‍රණයට අවශ්‍ය කඩදාසි නිපදවන කම්හල ගැන සෝදිසි කරගෙන යන බවයි. දැන් අප ඉදිරිපිට තිබෙන අන්තිම වාර්තාව ද එයයි. ඉතින් 1966 සිට අද වන තුරු මේ කම්හල ගැන සෝදිසි කර කර සිටියා මිස එය හැදුවේ නැහැ. අපි දන්නවා, එවැනි කම්හලක් ඉතා ලෙහෙසියෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයෙහි පිහිටුවන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

නට පුළුවන්කම තිබෙන බව. ඒ සඳහා අවශ්‍ය වන්නාවූ සියළුම අමු ද්‍රව්‍ය හම්බන් තොට දිස්ත්‍රික්කයෙහි තිබෙනවා.

අවුරුදු 5කට පමණ පෙර හම්බන්තොට දිස්ත්‍රික්කයේ දෙවන කඩදාසි කම්හලක් පිහිටුවන්නට යනවාය කියන උද්ඝෝෂණය තිබුණා. ඒ කාලයේ පැවති රජය එම අදහස පිළිගත්තායයි මා සිතනවා. කඩදාසි කර්මාන්තයට අවශ්‍ය අමු ද්‍රව්‍ය වාලච්චේනෙයි ප්‍රදේශයෙන් ලබා ගත හැකි ප්‍රමාණයට වැඩි ප්‍රමාණයක් හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් ලබා ගත හැකි බව ගරු ඇමතිතුමාට පෙන්වා දෙන්නට මා කැමතියි. අමු ද්‍රව්‍ය අතින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ කිසි අමාරුවක් නැහැ. ඒ වාගේම වලවේ ගඟෙන් ඕනෑ තරම් ජලය ලබා ගන්නත් පුළුවනි. හම්බන්තොට ප්‍රදේශයේ දෙවෙනි කඩදාසි කම්හල පිහිටුවනවාය කියන යෝජනාව ඉදිරිපත් වුණේ මීට අවුරුදු 5කට පමණ පෙරයි. අද දවසේ ලංකාවට අවශ්‍ය කඩදාසිවලින් සියයට 20ක පමණ ප්‍රමාණයක් තමයි, නැගෙනහිර කඩදාසි කම්හලෙන් ලැබෙන්නේ. 'යට කී අදහස ක්‍රියාත්මක කළොත් තවත් සියයට 50 කට වැඩි ප්‍රමාණයක් කඩදාසි ලබා ගන්නට හම්බන් තොට කම්හලෙන් පුළුවන් වෙනවා ඇති. එම නිසා අවුරුදු හතක පමණ කාලයක සිට දකින සිහිනයක් සැබෑ වන්නේ කවදාද කියන ප්‍රශ්නය මා අහන්නට කැමතියි. අවුරුදු හතක පමණ කාලයක සිට මේ අන්දමේ කඩදාසි කම්හලක් බලාපොරොත්තුවෙන් සිටි නමුත් තවම එය ඉටු වී නැහැ. එය ප්‍රමාද වන්නේ මන්දැයි මා අහනවා. මා දන්නේ නැහැ, පත්‍ර මුද්‍රණයට අවශ්‍ය කඩදාසි පිළිබඳව යම් කිසි විශේෂ රහසක් තිබෙනවා ද කියා. පිටරටින් ගෙන්වන පත්‍ර මුද්‍රණ කඩදාසි පිළිබඳවත් විශේෂ රහසක් හෝ ගුප්ත දෙයක් තිබෙනවාද කියා මා දන්නේ නැහැ. අළුත් කර්මාන්ත ඇමතිතුමාගෙන් අපි ඉල්ලා සිටිනවා, හැකි පමණ ඉක්මණින් තමුන්නාන්සේලාගේ රජය කාලයේදී මෙම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන ලෙස.

**එච්. එම්. නවරත්න මයා. (කෘෂිකර්ම හා ඉඩම් ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. எச். எம். நவரத்ன—விவசாய, காணி அமைச்சரின் பாராளுமன்றக் காரிய தரிசி)*

(Mr. H. M. Nawaratna—Parliamentary Secretary to the Minister of Agriculture and Lands)

ඒ කම්හල මිනිපෙට දෙන්න.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**

*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*

(Dr. W. Dahanayake)

කොහේහරි. අපට පත්‍ර මුද්‍රණ කඩදාසි කම්හලක් වහාම අවශ්‍යයයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට විශේෂයෙන් ඝණ කඩදාසිත් අවශ්‍යයයි. සුළු කර්මාන්තකරුවන් රාශියකට ඒවා අවශ්‍ය වෙනවා. ඔවුන් නැගෙනහිර කඩදාසි කම්හලෙන් තමන්ගේ ව්‍යාපාර සඳහා නොයෙකුත් විධියේ කඩදාසි ඉල්ලා සිටිනවා. එහෙත් ඔවුන්ට බෙදා දෙන්නට තරම් කඩදාසි ඇත්තේ නැහැ. එම නිසා සුළු කර්මාන්ත කරුවන්ට අවශ්‍ය කඩදාසි ප්‍රමාණයන් සපයන ලෙස නියෝග කරන හැටියට ගරු ඇමතිතුමාගෙන් මා ඉල්ලා සිටිනවා. සුළු කර්මාන්ත කරුවනුත් සුළු විධියට නමුත් නොයෙකුත් උදවියට රක්ෂා සපයා දෙනවා.

අ. භා. 2.44

**එම්. තෙන්නකෝන් මයා.**

*(திரு. எம். தென்னகோன்)*

(Mr. M. Tennakoon)

කර්මාන්ත හා විද්‍යා කටයුතු පිළිබඳ ඇමතිතුමාට පරණ පව්වලට උත්තර දෙන්නට සිදු වී තිබීම ගැන මා කනගාටු වෙනවා. කෙසේවෙතත් මෙවැනි වාර්තා ගැන ඉතා සුළුවෙන් සාකච්ඡා කර අතහැර දැමීම ජාතික අපරාධයක් වෙනවා. අද අපි සාකච්ඡා කරන්නේ නැගෙනහිර කඩදාසි කම්හල මගින් මහජන මුදල් නාස්ති කර දැමීම ගැන සඳහන්ව තිබෙන වාර්තාව ගැනයි. වර්ෂ තුනක වාර්ෂික වාර්තා අද අප ඉදිරිපිට තිබෙනවා. මේ වර්ෂ තුනේදීම මහජන මුදල් නාස්ති කර තිබෙනවා. එම නිසා මේවා ඒ තරම් පහසුවෙන් අනුමත කරන්නට පුළුවන්ය කියා මා විශ්වාස

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කරන්නේ නැහැ. සිතට එකඟව කෙනෙකුට මේ වාර්තා අනුමත කරන්නට බැරි වීමට හේතු මොනවාද යන්න මා ඉතාම ලුහුඬින් පෙන්වා දෙන්නම්. මේ වාර්තා මුද්‍රණය කර සැපයීමට වැය වන මුදල තරම්වත් මේ සංයුක්ත මණ්ඩලය වටිනවා ඇයි මා දන්නේ නැහැ. මේ වාර්තා එකින් එක හොඳට කියවා බලන්න. ඇත්ත වශයෙන්ම මේ වාර්තාවලට අනුව එකම වර්ෂය කදීවත් කඩදාසි සංයුක්ත මණ්ඩලයේ දියුණුවක් ඇති වී නැහැ. ගෙවී ගිය වර්ෂයේ අඩු ලුහුඬුකම් ගැන ඊළඟ වර්ෂයේදී ක්‍රියා නොකළාය යන්න සෑම වර්ෂයකම වාර්තාවල සඳහන් කර තිබෙනවා. 1963-64 වර්ෂයේ වාර්ෂික වාර්තාවේ 19 වන පිටුවේ මෙසේ සඳහන් වෙනවා :

"මීට ප්‍රථම ගණන් පරීක්ෂකයන් විසින් ස්ථාවර වත්කම්වල වටිනාකම හා පැවැත්මේ කාල සීමාවේ නිරවද්‍යතාවය හරි වැරදි බැලීමට නොහැකි වූ බව පවසා තිබියදීත්, ඒ පිළිබඳ අවශ්‍ය තොරතුරු අඩංගු වාර්තා සකස් කිරීමට පියවර ගෙන නොමැත."

ගණන් පරීක්ෂකයින් තම වාර්තාවලින් අඩුපාඩු පෙන්වා දෙන්නේ ඊළඟ වර්ෂයේදී යම් වෙනසක්—නිවැරදි කිරීමක්—කරාවිය යන බලාපොරොත්තුවෙනුයි. නමුත් මේ සංයුක්ත මණ්ඩලය ගණන් පරීක්ෂකයින්ගේ වාර්තාවලින් පෙන්වා දී තිබෙන කිසිම කරුණක් ගැන සැලකිල්ල යොමු කර නැහැ. කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් පවරා ගන්නා ලද බඩු ගැන තවමත් කිසිම වාර්තාවක් කර නොමැති බව ඊළඟ කොටසේ සඳහන් වෙනවා. මේ සංස්ථාවේ කොයි තරම් මහජන මුදලක් නාස්ති වෙනවාදැයි බලන්න. 20 වන පිටුවේ තිබෙන මේ ඡේදයෙන් මා කී කාරණය හොඳට ඔප්පු වෙනවා :

"(ඊ) දුම්රිය සයිඩින් ඉදි කිරීම සඳහා අත්තිකාරම් මුදලක් වශයෙන් 1963 සැප්තැම්බර් 30 වෙනි දින රු. 1,04,238 ක් ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට ගෙවා ඇත. පසුව මෙම මුදල දුම්රිය සයිඩින් ගිණුම යටතේ ප්‍රාග්ධනීත කර ඇත. ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් කරන ලද මෙම කාර්යය සනාථ කෙරෙන කිසිම ලිඛිත ලේඛන සාක්ෂියක් අප වෙත සපයා නොමැත."

බලන්න, කජු ඇට කොස් ඇට වගේ මහජන මුදලින් රු. 1,04,238 ක් මේ සංයුක්ත මණ්ඩලය වැය කර තිබෙන සැටි. කොයි ආකාරයට ඒ මුදල වැය කළා දැයි දැක්වෙන කිසිම ලිඛිත ලේඛන සාක්ෂියක් කොතැනකවත් නැහැ.

"............එම නිසා ශේෂ පත්‍රයෙහි පෙන්නුම් කර ඇති ස්ථාවර වත්කම්වල නියම වටිනාකම් අනුමත කිරීමට නොහැකිය."

තත්ත්වය ඒක නම් සිතට එකඟව මේ වාර්තා—අද පාර්ලිමේන්තුවට ඉදිරිපත්කර තිබෙන මේ වාර්තා—අනුමත කරන්නයැයි ගරු ඇමතිතුමා කියන්නේ කොහොමද? 21 වන පිටුවේ සඳහන් වන කොටසකුත් මා කියවන්නට සතුටුයි :

"**අතිකුත් තොග**—1964.3.31 දින දී ප්‍රධාන කාර්යාලයෙහි අමු ද්‍රව්‍ය තොගවල වටිනාකම රු. 6,831.30ක් බව දක්වා තිබේ. මෙම ගිණුමෙහි පසුගිය වසරෙන් ඉදිරියට ගෙනෙන ලද මුදල රු. 33,112.60 කි. ගිය වර්ෂයෙහි දී කරන ලද නිශ්චිත ප්‍රතිපාදනයන් යටතේ රු. 26,281.30 ක් කපා හැර ඇත. එවිට ශේෂය ව දැක්වෙන රු. 6,831.30 වටිනාකමට නියෝජනය වන ද්‍රව්‍යමය තොග නොමැති බැව් අපට පෙනින."

ඉතිරි මුදලෙහි වටිනාකමට තොග නැතිලු. ඊළඟට 23 වන පිටුවෙහි මෙසේ සඳහන් වෙනවා :

"**ඉන්ඩෙන්ට් නැන්පත් මුදල් ගිණුම්**—රු. 9,89,2,23.

ඒ සම්බන්ධයෙන් මෙන්න මෙහෙම කියනවා :

"අප වෙත ඉදිරිපත් කරන ලද ගිණුම් කෙටුම්පත්හි මුල් පිටපත අනුව රු. 7,00,000 ක් නොයෙකුත් ගිණුම්වලට මාරු කර ඇත. මෙම මාරු කිරීම්වලට අදාල කරුණු සනාථ කිරීමේ සාක්ෂි වශයෙන් කිසිම ලිඛිත ලේඛනයක් අප වෙත සපයා නොමැත."

ලක්ෂ 7 ක් වියදම් කර තිබෙන්නේ කොහොමද කියා ඇක්සයිස් පොතකවත් ලියා නැහැ.

ඊළඟට 27 වැනි පිටුවේ අධ්‍යක්ෂවරුන්ගේ ගමන් වියදම් ගැන කියනවා. ඒක බොහොම ලක්ෂණට කරන වැඩක්. ඒ ගැන මෙන්න මෙහෙම කියා තිබෙනවා :

"රජයේ අධ්‍යක්ෂවරයෙකු නොවන ඒ. එම්. මර්සා මහතා හට අගෝස්තු මාසයෙහිදී හිස්ව ගමන් කිරීමේ හිඟ මුදල් වශයෙන් රු. 821.60 ක් ගෙවා ඇත. එදින සිට සෑම ගමන් ගාස්තු ඉල්ලුම් පතක් සමග ඔහු හිස්ව ගමන් කිරීම සඳහා ද ගාස්තු ඉල්ලුම් කර ඇත. අපගේ අදහස අනුව මෙම අධ්‍යක්ෂවරයා මුදල් ලැබීමට සුදුස්සෙක් නොවේ."

ඔන්න අධ්‍යක්ෂවරුන් මුදල් පාවිච්චි කරන හැටි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

[එම්. තෙන්නකෝන් මයා.]

ඊළඟට කොන්ත්‍රාත් ගැන කියනවා. 28 වැනි පිටුවේ දෙවැනි ඡේදයේ මෙහෙම කියනවා:

"භාණ්ඩාගාරයේ 1004/275/567/සීඒ දරණ චක්‍ර ලේඛනය අනුව රජයේ සංස්ථා සඳහා මූල ද්‍රව්‍ය ආනයනය කිරීමේදී රේගු තීරු ගාස්තුවලින් නිදහස් කර ඇත. මේ කෙසේ වෙතත් මෙවැනි තීරු ගාස්තු ප්‍රමාණයන් සංස්ථාවේ ගිණුම්වල සටහන් වී තිබුණා නම් පමණකි ඒ පිළිබඳ පැහැදිලි වැටහීමක් ලබාගත හැකි වනුයේ."

ඒවා ගැන කිසිවක් සඳහන් වී නැහැ.

වී සහ ඉලුක් ගොවිතැන් කරන්නට ගොස් සිදු වී තිබෙන්නේ කුමක්ද? කොත්මලේ ගරු මන්ත්‍රීතුමාත් එය (ජේ. ඩී. වීරසේකර මයා.) සඳහන් කළා. හැම වර්ෂය කම පාඩු වෙනවා.

1963-64 වර්ෂයේ පාඩු නැහැ කියා හිතුවා. එහි වැඩියි. මේ වාර්තාවේ මෙන්න මෙහෙම සඳහන් කර තිබෙනවා:

(கௌரவ பீலிக்ஸ் ஆர். டீ. பண்டார நாயக்க—பொது நிர்வாகம், உள்ளூராட்சி, உள்நாட்டு அலுவல்கள் அமைச்சர்)
(The Hon. Felix R. D. Bandaranaike—Minister of Public Administration, Local Government and Home Affairs)

I move,

"That the Bill be now read a Second time."

The purpose of this Bill is to permit all public officers (other than the specified categories) to contest seats at Parliamentary Elections and to make them eligible to be elected or nominated to the Senate. There is another Bill in respect of local bodies.

මේ පනතටත් තුනෙන් දෙකක ඡන්දය අවශ්‍ය නිසා ගරු මන්ත්‍රීවරුන් සභා ගර්භයෙන් පිට නොගොස් මෙයද සම්මත කර ගන්නා හැටියට මං ඉල්ලා සිටිනවා. මෙම පණත ඉදිරිපත් කර තිබෙන්නේ රාජ්‍ය සේවාවේ යෙදී සිටින අයටත් පාර්ලිමේන්තු මැතිවරණවලට ඉදිරිපත් වන්න පුළුවන් වන අන්දමට දේශපාලන අයිතිවාසිකම් ලබා දීම පිණිසයි. ග්‍රාමසේවක නිලධාරින්, පොලිස් නිලධාරින්, යුද්ධ හමුදා නිලධාරින්, මැතිවරණ කොමසාරිස් තුමා, ඔඩිටර් ජනරාල්තුමා හා නඩුකාරවරුන් ආදී, රුපියල් 6,720 ට නොඅඩු මූලික පඩිනඩි ලබන අය හැර රාජ්‍ය සේවාවේ අනෙකුත් නිලධාරින් සියලුදෙනාටම එකී දේශපාලන අයිතිවාසිකම් ලැබෙන හැටියට මෙහි නීති සකසා තිබෙනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

வினா எடுத்தியம்பப்பெற்றது.

*Question proposed.*

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
(திரு. ஜே. ஆர். ஜயவர்தன)
(Mr. J. R. Jayewardene)

මට ප්‍රශ්නයක් අහන්න තිබෙනවා. මැතිවරණයකින් දිනන සේවකයා පාර්ලිමේන්තුවට හෝ පළාත් පාලන ආයතනයකට හෝ පත් වුණායින් පසු ඔහුට කලින් සිටි සේවයෙන් ඉන්න පුළුවන්ද?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක**
*(கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டார நாயக்க)*
(The Hon. Felix R. D. Bandaranaike)

බෑ. බෑ. මෙය සාමාන්‍යයෙන් ක්‍රියාත්මක කරන්න අප බලාපොරොත්තු වන්නේ පරිපාලන රෙගුලාසි යටතේයි. තරඟ කොට දිනන සේවකයාට පාර්ලිමේන්තුවට එන්න පුළුවනි.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

පළාත් පාලන ආයතනයකට ?

**ගරු ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක**
*(கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டார நாயக்க)*
(The Hon. Felix R. D. Bandaranaike)

පළාත් පාලන ආයතන මේ පනතට ඇතුළත් වන්නේ නෑ. ඒ සඳහා වෙනම පනතක් තිබෙනවා. මේ පනත යටතේ, රාජ්‍ය සේවාවෙහි යෙදී සිටින සේවක යෙකුට පාර්ලිමේන්තු මැතිවරණයකදී තරඟ කරන්නට වුවමනා නම් ඔහුට ඒ සඳහා නිවාඩු ආදී සියලුම පහසුකම් ලැබෙනවා. තරඟයෙන් ඔහු පැරදුනොත්, කලින් ඔහු රක්ෂාව කළ තැනට ආපසු යන්න පුළුවන් නිසා ප්‍රශ්නයක් මතු වන්නේ නෑ. දිනුවොත්, පාර්ලිමේන්තුවට එනවාද රාජ්‍ය සේවාවට යනවාද යන කරුණ ගැන තීන්දුවක් කර ගන්නට ඔහුට සිදු වෙනවා. දිනන සේවකයා මහජන සේවය සඳහා පාර්ලිමේන්තුව වඩා අගය කරනු ඇත යන්නයි අපගේ බලාපොරොත්තුව.

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

ඒ නීති කොහෙද තිබෙන්නේ ?

**ගරු ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක**
*(கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டார நாயக்க)*
(The Hon. Felix R. D. Bandaranaike)

ඒවා මේ පනතෙහි අඩංගු වී නෑ. මේ පනත ඉදිරිපත් කර තිබෙන්නේ දැනට තිබෙන අවහිරකම ඉවත් කිරීම පිණිස පමණයි.

**කේ. තුරෙයිරත්නම් මයා.** (පේදුරු තුඩුව)
*(திரு. கே. துரைரத்தினம்—பருத்தித் துறை)*
(Mr. K. Thurairatnam—Point Pedro)

If a person contests an election and loses, could he get back to the Public Service then ?

**ගරු ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක**
*(கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டார நாயக்க)*
(The Hon. Felix R. D. Bandaranaike)

After losing an election, yes. If he wins, he has got to elect whether to revert or not. Once he elects to continue, then he has already chosen his political cause. He cannot have it both ways. In the first contest if he were to lose, he will be given leave for the purpose for the period of the contest, and he will be free to get back his job in the Public Service without a break.

**අගුස්තීනු පොන්සේකා මයා.** (වෙන්නප්පුව)
*(திரு. அகுஸ்தீனு பொன்சேகா—வென்னப் புவ)*
(Mr. Augustheenu Fonseka—Wennappuwa)

යම් සේවකයකු මැතිවරණයකින් ජයග්‍රහණය කර පාර්ලිමේන්තුවට පත් වුණාට පසු ඒ අවුරුදු ගණන අපතේ නොහැර ඔහුට විශ්‍රාම ගන්න ඉඩ දෙන්න බැරිද ?

**ගරු ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක**
*(கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டார நாயக்க)*
(The Hon. Felix R. D. Bandaranaike)

එය ඔහු සේවය කළ කාල සීමාව අනුව කෙරෙන දෙයක්. ඒ සම්බන්ධ රෙගුලාසි දැනටත් තිබෙනවා. අවුරුද්දක් රජයේ සේවයේ සිටි කෙනකු මහා මැතිවරණයක් තරඟ කොට පාර්ලිමේන්තුවට පැමිණියොත් ඔහුට පෙන්ෂන් ලබන්න පුළුවන්කමක් නෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**පොන්සේකා මයා.**
*(திரு. பொன்சேகா)*
(Mr. Fonseka)
පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වශයෙන් පත් වුණාය යන හේතුව උඩ ඔහුට විශ්‍රාම ගන්න ඉඩ දෙන්න බැරිද?

**ගරු ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක**
*(கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டார நாயக்க)*
(The Hon. Felix R. D. Bandaranaike)
රජයේ සේවය කළ කාල සීමාව අනුව පමණයි, විශ්‍රාම ගන්න ඉඩ දෙන්න පුළුවන්.

**පොන්සේකා මයා.**
*(திரு. பொன்சேகா)*
(Mr. Fonseka)
මගේ පෞද්ගලික ප්‍රශ්නය මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි. මා අවුරුදු 22 ක් ගුරුවරයකු හැටියට සේවය කළා. එහෙත්, මා පාර්ලිමේන්තුවට පත් වුණු නිසා මගේ අවුරුදු 22 ක සේවා කාලය සම්පූර්ණයෙන්ම දෙපාර්තමේන්තුව විසින් අහක දැම්මා. මට විශ්‍රාම ගන්නට දෙපාර්තමේන්තුව ඉඩ දෙන්නේ නෑ.

**ගරු ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක**
*(கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டார நாயக்க)*
(The Hon. Felix R. D. Bandaranaike)
ඒ සම්බන්ධයෙන් පරිපාලන රෙගුලාසි යටතේ නිසි විධිවිධාන සලස්වන්න ඕනෑ. මේ පණත ඉදිරිපත් කරන්නේ, රාජ්‍ය සේවාවේ යෙදී සිටින අයට දේශපාලන නිදහස දීම සම්බන්ධයෙන් ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන අවහිරකම් මඟහැරවීමට පමණයි.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யூ. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)
මා මතු කරණ ප්‍රශ්නය සම්බන්ධයෙන් පරිපාලන රෙගුලාසි සකස් කරනවාදැයි ගරු ඇමතිතුමාගෙන් දැන ගන්න කැමතියි. ආණ්ඩුවේ යම් සේවකයකු නාම යෝජනා බාර දී මැතිවරණයට ඉදිරිපත් වුණු දවසේ සිට ඒ තැනැත්තාට පඩි රහිත නිවාඩුවක් දිය යුතුයි. ඒ මැතිවරණ කාලයේදී පඩි නැති නිවාඩු පිටයි වැඩ කරගෙන යන්නෙ. ඊළඟට මන්ත්‍රීවරයෙක් වශයෙන් ඒ පුද්ගලයා තේරුනොත් එම සේවකයාට තමන්ගේ අයිතිවාසිකම් ලබා ගන්න පුළුවන් විය යුතුයි. මා හිතන හැටියට ඒ සේවකයාගේ අයිතිවාසිකමක් හැටියට, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් සිටින කාලයට පඩි රහිත නිවාඩු ඉල්ලා සිටින්න පුළුවනි. සමහර විට අවුරුදු 5 ක කාලයක් ඔහුට පාර්ලිමේන්තුවේ සිටින්න ඉඩ ලැබේවි. ඒ කාලයට පඩි රහිත නිවාඩු ඉල්ලා සිටින්න පුළුවනි.

**ගරු ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක**
*(கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டார நாயக்க)*
(The Hon. Felix R. D. Bandaranaike)
එහෙම කරන්න බැහැ.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யூ. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)
එහෙම නම් තමුන්නාන්සේ මොකක්ද ඒ අයට කරන්නෙ? යම්කිසි විධියකින් ඒ පුද්ගලයා ඊළඟ මැතිවරණයෙන් පරාජය වුණහොත් මොකක්ද කරන්නෙ? ඒ ගැන කිසිම දෙයක් මෙහි සඳහන් වන්නේ නැහැ.

**ගරු ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක**
*(கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டார நாயக்க)*
(The Hon. Felix R. D. Bandaranaike)
ඒ අයට "retirement option" දෙනවා. එම රෙගුලාසි මෙයට අදාළ නැති නිසා මෙහි සඳහන් වන්නේ නැහැ. සේවය කළ කාලය අනුව සලකා ඔවුන්ට "retirement option" දෙනවා.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யூ. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)
ආපසු සේවයට බැඳෙන්න බැරිද?

**ගරු ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක**
*(கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டார நாயக்க)*
(The Hon. Felix R. D. Bandaranaike)
අලුත් සේවකයෙක් හැටියට බැඳෙන්න පුළුවනි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)

සේවකයන් මේ ගැන පැහැදිලි විස්තර යක් දැනගන්න කැමතියි. ඒ නිසා එය පැහැදිලි කරගන්නු.

**ගරු ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක**
*(கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டாரநாயக்க)*
(The Hon. Felix R. D. Bandaranaike)

ඔනෑම නිලධාරියෙක් මැතිවරණයකට තරඟ කරන්න බලාපොරොත්තු වෙනවා නම් ඒ තරඟ කරන අවස්ථාවේදී පඩි රහිත නිවාඩු ගැනීමේ වරප්‍රසාද ඔහුට ලැබෙනවා. පරිපාලන රෙගුලාසි යටතේ ඔහුට එම අයිතිය ලබා දී තිබෙනවා. ඒ පඩි රහිත නිවාඩු දෙන්නේ මැතිවරණ කාලයටයි. මැතිවරණ කාලයේදී පඩි නැති නිවාඩු ගන්න පුළුවනි. ඔහු යම් විධියකින් මන්ත්‍රී වරයෙක් වශයෙන් තේරුනොත් ඔහු සේවය කළ කාලය අනුව සලකා ඔහුට "retirement option" දෙනවා. ඊට පසු වත් පාර්ලිමේන්තු කාලය අවසන් වුණාට පසුවත් ඔහු නැවත සේවයට බැඳෙන්න කල්පනා කරනවා නම් ඔහුට අලුත් සේවක යෙක් හැටියට බැඳෙන්න පුළුවනි. තමුන් නාන්සෙටයි මටයි පාර්ලිමේන්තු අයිතිවාසි කම් නැති වුණාට පසුව—

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)

තමුන්නාන්සේ මේ ගැන තව ටිකක් කල්පනා කරනවා නම් හොඳයි. මට මතක හැටියට—හරියටම සහතික කරන්න බැහැ —එංගලන්තයේ රෙගුලාසියක් තිබෙනවා, ඒ රෙගුලාසිය අනුව යම් සේවකයෙක් පාර්ලිමේන්තුවට ගොස් කවදා හෝ පාර්ලි මේන්තුවෙන් අයින් වී පැමිණි දවසක නැවත රක්ෂාවට බැඳෙන්න ඔහුට අයිති වාසිකම තිබෙනවා. ඔහු පාර්ලිමේන්තුවේ සිටින්නේ පඩි රහිත නිවාඩු පිටයි. පාර්ලි මේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් සේවය කළ සම්පූර්ණ කාලය වැටුප් රහිත නිවාඩු වක්—No-pay leave—ගත කළ කාල යක් හැටියට සලකා ඔහුට නැවත රක්ෂාව කට යෑමට ඉඩකඩ ලැබෙනවාද ?

**ගරු ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක**
*(கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டாரநாயக்க)*
(The Hon. Felix R. D. Bandaranaike)

ඒක බොහොම භයානක දෙයක්. රාජ්‍ය සේවයයි, දේශපාලනයයි කියන්නේ එකක් නොව දෙකක්. රාජ්‍ය සේවයත් දේශපාලනයත් යන දෙක කලවමට සැල කෙන විධියට ගණන් ගන්නට ගියොත් සිදු විය හැක්කේ කුමක්දැයි කල්පනා කළ යුතුව තිබෙනවා. දේශපාලනයත්, පරි පාලනයත් වෙන් වශයෙන් තිබීමෙන් සැහෙන ප්‍රයෝජනයක් තිබෙන නිසයි, ඒ විධියට ක්‍රියා කරන්නට අපි බලාපො රොත්තු වන්නේ. දේශපාලනයේ පක්ෂ භේදය තිබෙන තුරු අපට ඒ ආකාරයට කල්පනා කරන්නට සිදු වෙනවා. ඒ නිසා එහෙම දෙයක් අපි කරන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම එංගලන්තයේත් අද තිබෙන්නේ එවැනි තත්ත්වයක් නො වෙයි. බොහෝ දුරට කල්පනා කිරීමෙන් පසුවයි, මේ විධියට ක්‍රියා කරන්නට අපි තීරණය කෙළේ. දැන් ඉදිරිපත් කරන අද හස ඇත්තෙන්ම එංගලන්තයේ තිබෙන නීතිරීතිවලට වඩා දියුණු දේශපාලන මට්ටමකින් සකස් කළ දෙයක් බවත් එවැනි දේශපාලනයක් උඩ අපි ගමන් කරන බවත් ආඩම්බරයෙන් මේ ගරු සභා වට දන්වන්නට කැමතියි.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)

ඒ සඳහා අවශ්‍ය රෙගුලාසි දැන් සකස් කර තිබෙනවාද ?

**ගරු ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක**
*(கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டாரநாயக்க)*
(The Hon. Felix R. D. Bandaranaike)

ඔව්. ඒවා කැබිනට් මණ්ඩලය පිළිගෙන තිබෙනවා. පොදු සේවා කොමිෂන් සභාවත් ඒවා පිළිගෙන තිබෙනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**වාසුදේව නානායක්කාර මයා.** (කිරි ඇල්ල)

(திரு. வாசுதேவ நாணயக்கார—கிரி யெல்ல)

(Mr. Wasudeva Nanayakkara—Kiriella)

පරිපාලන සේවයෙන් විශ්‍රාම ලබා මැතිවරණවලට ඉදිරිපත් වූ අයත් ඉන්නවා. පසුගිය මැතිවරණයේදීත් ඒ ආකාරයට ඉදිරිපත් වූ අය සිටිනවා. මේ වැඩ පිළිවෙළ යටතේ ඒ උදවියට ඉඩක් ලැබෙන්නේ නැති බව පෙනෙනවා. මේ නීතිය ආපසු, පසුගිය කාලයටත් බලපාන ලෙස ක්‍රියාත්මක වන ආකාරයට සකස් කෙළේ නැත්නම් ඒ උදවියට මෙයින් ප්‍රයෝජනයක් ලැබෙන්නේ නැහැ. උඩ-පරණගම ගරු මන්ත්‍රීතුමා (දෙලුන්ගහවත්ත මයා.) සම්බන්ධයෙනුත් ඇති වන්නේ මේ තත්ත්වයයි. එතුමාත් මැතිවරණ කටයුතුවලට ඉදිරිපත් වීම සඳහා සේවයෙන් විශ්‍රාම ගත් කෙනෙක්.

**ගරු ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක**

(கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டார நாயக்க)

(The Hon. Felix R. D. Bandaranaike)

මෙතන තිබෙන්නේ එකම එක ප්‍රශ්නයයි. ඇත්ත වශයෙන්ම කිසිම ආණ්ඩුවකට පුළුවන්කමක් ඇති වන්නේ නැහැ, පරණ පව් සියල්ලක්ම ගෙවා දමන්නට. අනෙක් ආණ්ඩුවලින් කරන ලද සියල්ලක්ම හරිගස්සන්නට පුළුවනැයි වගකීමක් ඇතිව කියන්නට පුළුවන්කමක් මට ඇත්තේ නැහැ. කරන්නට පුළුවන්කමක් තිබෙනවා නම් මම නුදුරු අනාගතය පිළිබඳව යම් සහතිකයක් දීමට උත්සාහ ගන්නා බව පමණක් කියන්නට කැමතියි.

**එස්. බී. හේරත් මයා.** (හිරියාල)

(திரு. எஸ். பி. ஹேரத்—ஹிரியால)

(Mr. S. B. Herat—Hiriyala)

ගරු ඇමතිතුමාගෙන් මාත් ප්‍රශ්නයක් අහන්නට කැමතියි. මාත් හිටපු රජයේ සේවකයෙක්. ඔය නිදහස ලැබෙන්නේ මැතිවරණයකට ඉදිරිපත් වන රජයේ සේවකයන්ට පමණක්ද? එහෙම නැතිව ආණ්ඩුවේ සේවකයන් සියලු දෙනාටම දේශපාලනය කරන්නට ඉඩ දෙනවාද?

**ගරු ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක**

(கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டார நாயக்க)

(The Hon. Felix R. D. Bandaranaike)

පරිපාලන රෙගුලාසි යටතේ, මෙහි සඳහන් කර තිබෙන කොටස්වලට හැර සෙසු උදවියට සම්පූර්ණ දේශපාලන අයිතිවාසිකම් ලැබෙන හැටියටයි අපි ක්‍රියා කරන්නේ. ඒ සඳහා අවශ්‍ය පරිපාලන රෙගුලාසි සියල්ලක්ම සකස් කර තිබෙනවා.

ප්‍රශ්නය විමසන ලදී.

කටහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

வினா விடுக்கப்பெற்றது.

குரல்களின்படி 'ஆம்' என்றவர்களுக்கு வெற்றி யென உப சபாநாயகர் அவர்களால் பிரகடனப் படுத்தப்பட்டது.

*Question put.*

MR. DEPUTY SPEAKER, *having collected the Voices, declared that the "Ayes" had it.*

**ගරු ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක**

(கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டார நாயக்க)

(The Hon. Felix R. D. Bandaranaike)

ඡන්ද ගණන් කිරීමක් අවශ්‍යයි.

**මන්ත්‍රී මණ්ඩලය 48 වන ස්ථාවර නියෝගය යටතේ—පක්ෂව 118 ; විරුද්ධව කිසිවකු නොමැතිව; යනුවෙන්— බෙදුණේය.**

சபை, 48 ஆம் நிலையற் கட்டளையின் கீழ் பிரிந்தது : சார்பாக 118 ; எதிராக : இல்லை.

*The House divided (under Standing Order No. 48) ; Ayes 118 ; Noes Nil.*

**කෙටුම්පත් පණත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.**

அதன்படி, மசோதா இரண்டாம் முறையாக மதிப்பிடப்பெற்றது.

*Bill accordingly read a Second time.*

**මතු පළ වන යෝජනාව සභාසම්මත විය.**

"කෙටුම්පත් පණත පූර්ණ මන්ත්‍රී මණ්ඩල කාරක සභාවට පැවරිය යුතුය."—[ගරු ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක.]

பின்வரும் பிரேரணை ஏற்றுக் கொள்ளப்பட்டது :

"மசோதா முழுச்சபைக் குழுவுக்குச் சாட்டப் படுமாக"—[கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டார நாயக்க]

*Resolved :*

"That the Bill be referred to a Committee of the Whole House."—[*The Hon. Felix R. D. Bandaranaike.*]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**කාරක සභාවේදී සලකා බලන ලදී.**
**[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]**

*முழுச் சபைக் குழுவில் ஆராயப் பெற்றது.*
*[உப சபாநாயகர் அவர்கள் தலைமை தாங்கினார்கள்.]*

*Considered in Committee.*
[MR. DEPUTY SPEAKER *in the Chair.*]

**1 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*1 ஆம் வாசகம் மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.*

*Clause 1 ordered to stand part of the Bill.*

CLAUSE 2.—(*Amendment of Section 13 of Chapter 379*)

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

මම අහන්න කැමතියි, ඇයි මෙහි රුපියල් 6,720 ක් සහ රුපියල් 7,200 ක් වශයෙන් ක්‍රම දෙකක වැටුප් සීමාවක් ඇති කර තිබෙන්නෙ කියා.

**ගරු ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක**
*(கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டாரநாயக்க)*
(The Hon. Felix R. D. Bandaranaike)

ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල නියුක්ත අය සඳහත්, නීතිගත සංස්ථාවල නියුක්ත අය සඳහාත්, නීතිගත සංස්ථාවල නියුක්ත දෙකක් තිබෙන්නෙ. අපේ අදහස තිබුණේ එකම සීමාවක් ඇති කිරීමටයි. එහෙත් මෙසේ සීමා දෙකක් ඇති කිරීමට හේතුව මේකයි. විශේෂයෙන්ම විශ්‍රාම වැටුප් ආදී අයිතිවාසිකම් නොලැබෙන සංස්ථා නිලධාරීන්ට තිබෙන වරප්‍රසාදවලට වඩා නොයෙකුත් වරප්‍රසාද ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල නිලධාරීන්ට තිබෙන නිසා සංස්ථාවල නිලධාරීන්ගේ වැටුප් ක්‍රමයට වඩා ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල නිලධාරීන්ගේ වැටුප් ක්‍රමය ටිකක් අඩුයි. මෙහි සීමා කර ඇති රුපියල් 6,720 සේ සහ රුපියල් 7,200 යේ වැටුප් සීමා දෙකට අයත් වැටුප් ක්‍රමය අදාළ වන්නේ දෙපොළේම සිටින එක හා සමාන එකම මට්ටමක උදවියටයි. එනම් පරිපාලන වගකීම් සහිත මට්ටමටයි. අපි කවුරුත් පිළිගත යුතුයි, යම් යම් තීන්දු ගන්නට වන්නේ එවැනි ඉහළ මට්ටමේ අයට බව. සමහර විට ඒ තීන්දු දේශපාලනයට බලපාන්න පුළුවන්. එල්. බී. ද සිල්වා වැටුප් කොමිසමේ ඒකාබද්ධ වැටුප් ක්‍රමයට අනුවයි, මෙම සීමා ඇති කර තිබෙන්නෙ. එහි මට්ටම නම් කලින් තිබුණ රුපියල් 4,800 මූලික වැටුප් මට්ටමයි. ආදායම් පාලක නිලධාරියකු වැනි එවැනි වගකීම් තිබෙන අයට, ආසනයක් තරඟ කිරීමට බලාපොරොත්තුව සිටියදී මෙවැනි නිදහසක් දෙනවා නම් සමහර විට තමන්ගේ ගේ දොර ලක්ෂණට හදාගන්නට පුළුවන් වෙන්න ඉඩ තිබෙනවා. එම නිසා එවැනි වගකීම් නැති අයටයි, එක්තරා වැටුප් සීමාවක් නියම කරගෙන දේශපාලන අයිතිවාසිකම් දෙන්නට බලාපොරොත්තු වන්නෙ. ඇත්ත වශයෙන්ම "ඇඩ්මිනිස්ට්‍රේටිව් රෙස්පොන්සිබිලිටි" සහ "පොලිටිකල් පවර්ස්" තිබෙන අයට දේශපාලන අයිතිවාසිකම් දීම සුදුසු නැත කියන එකයි අපේ සාමාන්‍ය හැඟීම. එසේ දුන්නොත් දේශපාලන පක්ෂ ක්‍රමය අතින් එය කොතරම් භයානකද? අපි හිතමු, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට පක්ෂව සිටින උසස් කෙනකු ගැන. එවැනි උසස් කෙනෙකුට තමන්ගේ අවශ්‍යතා බොහෝම ලක්ෂණට ඉටු කරවා ගන්න පුළුවන් වෙනවා නොවේද? තමන්ගේ අයිතිවාසිකම් රැක ගන්නට පුළුවන් වෙනවා නොවේද? ඒ නිසා තමුන්නාන්සේලාගේම ආරක්ෂාවටයි, මේ නීතිය මෙසේ සකස් කර තිබෙන්නෙ. මා හිතනවා ගරු විරුද්ධ පක්ෂයේ නායකතුමා ඒක පිළිගන්නවා ඇත කියා.

**2 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

*2 ஆம் வாசகம் மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.*

*Clause 2 ordered to stand part of the Bill.*

**ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.**

**පනත් කෙටුම්පත, සංශෝධන රහිතව, වාර්තා කරන ලදී.**

*சட்டமாகு வாசகமும் தலைப்பும் மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.*

*மசோதா திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

*Bill reported without Amendment.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක**
(கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டாரநாயக்க)
(The Hon. Felix R. D. Bandaranaike)

"මෙම පනත් කෙටුම්පත දැන් තුන් වන වර කියවිය යුතුය" යි යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදී.

කටහඬවල් අනුව "පක්ෂ" මන්ත්‍රීන්ට ජය බව නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

வினா விடுக்கப்பெற்றது.

குரல்களின்படி 'ஆம்' என்றவர்களுக்கு வெற்றியென உப சபாநாயகர் அவர்களால் பிரகடனப் படுத்தப்பட்டது.

*Question put.*

MR. DEPUTY SPEAKER, *having collected the Voices, declared that "Ayes" had it.*

**ගරු ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක**
(கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டாரநாயக்க)
(The Hon. Felix R. D. Bandaranaike)

ඡන්දය ගණන් කිරීම අවශ්‍යයි.

මන්ත්‍රී මණ්ඩලය 48 වන ස්ථාවර නියෝගය යටතේ—පක්ෂව 117 ; විරුද්ධව කිසිවකු නොමැතිව ; යනුවෙන්—බෙදුණේ ය.

சபை, 48 ஆம் நிலையற் கட்டளையின் கீழ் பிரிந்தது : சார்பாக 117 ; எதிராக : இல்லை.

*The House divided (under Standing Order No. 48) : Ayes 117 ; Noes Nil.*

පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.

அதன்படி, மசோதா மூன்றும் முறையாக மதிப்பிடப்பெற்று நிறைவேற்றப் பெற்றது.

*Bill accordingly read the Third time, and passed.*

## ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත

## உள்ளூராதிகார சபைகள் தேர்தல்கள் (திருத்தம்) மசோதா

## LOCAL AUTHORITIES ELECTIONS (AMENDMENT) BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.

இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப் பட்டது.

*Order for Second Reading read.*

අ. භා. 6.12

**ගරු ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක**
(கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டாரநாயக்க)
(The Hon. Felix R. D. Bandaranaike)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් සංශෝධන පනතේ කෙටුම්පත සඳහා තුනෙන් දෙකක ඡන්ද ලබා ගැනීම අවශ්‍ය නැහැ. මේ පනතේ අඩංගු වන්නේත් ඊට කලින් සම්මත කරන ලද පනතේ ප්‍රතිපත්තිය මයි. ඇතැම් වර්ගවල රජයේ සේවකයන්ට පළාත් පාලන ඡන්ද විමසීම්වලදී ආසන තරඟ කිරීමට සහ ප්‍රාදේශීය බල මණ්ඩල වල අසුන් ගෙන ඡන්දය දීමට අයිතිය දීමයි, මේ පනතෙන් කෙරෙන්නේ. එම නිසා මෙම පනත දෙවන වර කියවිය යුතු යයි මම දැන් යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

කෙටුම්පත් පණත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

அதன்படி, மசோதா இரண்டாம் முறையாக மதிப்பிடப்பெற்றது.

*Question put, and agreed to.*
*Bill accordingly read a Second time.*

මතු පළ වන යෝජනාව සභාසම්මත විය:

"පනත් කෙටුම්පත පූර්ණ මන්ත්‍රී මණ්ඩල කාරක සභාවට පැවරිය යුතුය."—[ගරු ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක]

பின்வரும் பிரேரணை ஏற்றுக் கொள்ளப்பட்டது :

"மசோதா முழுச்சபைக் குழுவுக்குச் சாட்டப்படுமாக" [கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டாரநாயக்க.]

*Resolved :*

"That the Bill be referred to a Committee of the Whole House."—[*The Hon. Felix R. D. Bandaranaike.*]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.

[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப் பெற்றது.

[உப சபாநாயகர் அவர்கள் தலைமை தாங்கினர்கள்]

*Considered in Committee.*

[MR. DEPUTY SPEAKER *in the Chair.*]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

1 වන සහ 2 වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

ප්‍රඥප්ති වගන්ති සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන රහිතව, වාර්තා කරන ලදී.

*1 ஆம் 2 ஆம் வாசகங்கள் மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.*

*சட்டமாகு வாசகமும் தலைப்பும் மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.*

*மசோதா திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Clauses 1 and 2 ordered to stand part of the Bill.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

*Bill reported without Amendment.*

**ගරු ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක**
*(கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டார நாயக்க)*
(The Hon. Felix R. D. Bandaranaike)

"පනත් කෙටුම්පත දැන් තුන් වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, மசோதா மூன்றும் முறையாக மதிப்பிடப்பெற்று நிறைவேற்றப் பெற்றது.*

*Question put, and agreed to.*

*Bill accordingly read the Third time, and passed.*

## බැංකු හර බදු පනත් කෙටුම්පත

*வங்கிப் பற்றுக்கள் வரி மசோதா*

## BANK DEBITS TAX BILL

දෙවන වර කියවීමේ නියෝගය කියවන ලදී.

*இரண்டாம் மதிப்பீற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*Order for Second Reading read.*

අ. භා. 6.14

**ගරු ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා (වැවිලි කර්මාන්ත ඇමති සහ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථා කටයුතු ඇමති)**
*(கௌரவ கலாநிதி கொல்வின் ஆர். த சில்வா—தோட்டத் தொழில் அமைச்சரும், அரசியலமைப்பு அலுவல்கள் அமைச்சரும்)*
(The Hon. Dr. Colvin R. de Silva—Minister of Plantation Industry and Minister of Constitutional Affairs)

I move, on behalf of the Hon. Minister of Finance,

"That the Bill be read a Second time."

This is really a renewal of a very old position—the imposing of a tax on debits made against current accounts in commercial banks and to provide for matters connected therewith.

Once upon a time this was called the Cheque Tax, and much discussion arose as to whether this would encourage the cheque habit and so on. Then the Minister of Finance of the last Government—I rather think in terms of some arrangements he had with the foreign banks to whom he wanted to return the accounts that had been stopped—withdrew the law. We are restoring it. That is all there is to this Bill. And I would assure the House that there is nothing sinister in it, and nothing which any of us cannot vote for.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*வினா எடுத்தியம்பப்பெற்றது.*

*Question proposed.*

**ජේ. ආර්. ජයවර්ධන මයා.**
*(திரு. ஜே. ஆர். ஜயவர்தன)*
(Mr. J. R. Jayewardene)

May I ask the Hon. Minister whether this is the same as the previous Bill which was withdrawn? I have not been able to compare the two Bills, but if this is the same, we have no objection.

**ගරු ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கௌரவ கலாநிதி கொல்வின் ஆர். த சில்வா)*
(The Hon. Dr. Colvin R. de Silva)

It is the same.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක**
*(கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டார நாயக்க)*
(The Hon. Felix R. D. Bandaranaike)

It is identical. I raised the question once when Mr. Wanninayake moved to repeal the original Bank Debits Tax Bill. I think on that occasion I opposed it and the present Minister of Finance supported the then Minister of Finance. So we had a discussion on the matter and I went into it afresh at a Cabinet meeting, and I am satisfied that it is the identical thing.

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

කෙටුම්පත් පණත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, மசோதா இரண்டாம் முறையாக மதிப்பிடப்பெற்றது.*

*Question put, and agreed to.*

*Bill accordingly read a Second time.*

මතු පළ වන යෝජනාව සභාසම්මත විය:

"පනත් කෙටුම්පත පූර්ණ මන්ත්‍රී මණ්ඩල කාරක සභාවට පැවරිය යුතුය."—[ගරු ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා.]

பின்வரும் பிரேரணை ஏற்றுக் கொள்ளப்பட்டது.

*"மசோதா முழுச்சபைக் குழுவுக்குச் சாட்டப்படுமாக."—[கலாநிதி கொல்வின் ஆர். த சில்வா.]*

*Resolved :*

"That the Bill be referred to a Committee of the Whole House."—[*The Hon. Dr. Colvin R. de Silva.*]

**කාරක සභාවේහිදී සලකා බලන ලදී.**

[නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]

*குழுவில் ஆராயப்பெற்றது.*

*[உப சபாநாயகர் அவர்கள் தலைமை தாங்கினார்கள்.]*

*Considered in Committee.*

[Mr. Deputy Speaker *in the Chair.*]

1 වන වගන්තියේ සිට 17 වන වගන්තිය තෙක් පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන රහිතව, වාර්තා කරන ලදී.

*1 ஆம் வாசகத்திலிருந்து 17 ஆம் வாசகம் வரை மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.*

*சட்டமாகு வாசகமும் தலைப்பும் மசோதாவின் பகுதியாக இருக்க வேண்டுமென கட்டளையிடப்பட்டது.*

*மசோதா திருத்தமின்றி அறிக்கை செய்யப்பட்டது.*

*Clauses 1 to 17 ordered to stand part of the Bill.*

*Enacting Clause and Title ordered to stand part of the Bill.*

*Bill reported without Amendment.*

**ගරු ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා**
*(கௌரவ கலாநிதி கொல்வின் ஆர். த சில்வா)*
(The Hon. Dr. Colvin R. de Silva)

I move,

"That the Bill be now read the Third time."

ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන්වන වර කියවා සම්මත කරන ලදී.

*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*அதன்படி, மசோதா மூன்றும் முறையாக மதிப்பிடப்பெற்று நிறைவேற்றப் பெற்றது.*

*Question put, and agreed to.*

*Bill accordingly read the Third time, and passed.*

## කල්තැබීම

### ஒத்திவைப்பு

### ADJOURNMENT

යෝජනාව ඉදිරිපත් කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

"මන්ත්‍රී මණ්ඩලය දැන් කල් තැබිය යුතුය"—[ගරු කේ. බී. රත්නායක].

*"சபை இப்பொழுது ஒத்திவைக்கப்பெறுமாக"—[கௌரவ கே. பி. ரத்னயக்க] எனும் பிரேரணை பிரேரிக்கப்பட்டு, வினா எடுத்தியம்பப் பெற்றது.*

*Motion made, and Question proposed,*

"That the House do now adjourn"—[*The Hon. K. B. Ratnayake.*]

අ. භා. 6.20

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யூ. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෙරේදා රාත්‍රියේ ගල්කිස්ස පොලීසියෙන් සිදු වුණු ඉතාම කනගාටුදායක, එමෙන්ම ඉතාම බරපතල සිද්ධියක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගැන ගරු අගමැතිණියට මතක් කරන්න කැමතියි. එම සිද්ධිය සම්බන්ධයෙන්, මේ මස 10 වනදා "ජනදින" පත්‍රයේ පළ කර ඇති වාර්තාව පළමුවෙන්ම කියවන්න කැමතියි. එය **මෙසේයි:**

"බයිසිකලයක නැග දෙදෙනකු **සමග ඊයේ** රාත්‍රියේ ගල්කිස්ස පොලීසිය ඉදිරිපිටින් ගිය දෙහිවල-ගල්කිස්ස නගර සභාවේ මන්ත්‍රීවරයෙකුට ලේ හැලෙන තුරු පොලීසිය මඟින් පහර දී ඇත. මෙම පහර දීමෙන් බරපතල තුවාල ලැබූ නාගරික මන්ත්‍රී සොලමන් පෙරේරා මහතා ඉතා මත් බරපතල තත්ත්වයකින් දකුණු කොළඹ මහා රෝහලේ ප්‍රතිකාර ගන්නා බවද වාර්තාවේ. මෙම පහර දීමට ද්‍රවිඩ උප පරීක්ෂකවරයෙකුද හත් හවුලට ගැතිකම් දැක්වූ පොලිස් සැරයන්වරයෙකු ඇතුළු පොලිස් පිරිසක් සහභාගි වූ බව නාගරික මන්ත්‍රී සොලමන් පෙරේරා මහතා "ජනදින" ට පැවසීය.

තවත් පුද්ගලයකු සමග බයිසිකලයක නැඟී පොලීසිය ඉදිරියෙන් යාම මෙම පහර දීමට හේතු වී ඇති අතර පොලීසිය පහර දෙන අවස්ථාවේ තමා නාගරික මන්ත්‍රීවරයෙකු බව කිහිප වරක් කිවද, "මැම්බර් නෝ මැම්බර් කරනවා" යයි කියමින් පෙර දුන් බවද සොලමන් පෙරේරා මහතා පැවසීය......"

මේ සම්බන්ධයෙන් දීර්ඝ ලෙස යමක් කියන්නට මා බලාපොරොත්තු වෙන්නේ නැහැ. ගරු අගමැතිවරිය මේ කාරණය ගැන පරීක්ෂණයක් පවත්වා නිසි අන්ද මට ක්‍රියා කරනවා ඇතැයි මා බලාපොරොත්තු වෙනවා. ඇත්ත වශයෙන්ම මා කල්පනා කරනවා, මේ සිද්ධිය ඉතා මත්ම වැදගත්ය කියා. මේ සිද්ධිය ඇත්ත නම්, නාගරික මන්ත්‍රීවරයකුට පොලීසියට ගෙන ගොස් නොනිසි විධියට පහර දුන්නා නම්, සාමාන්‍ය පුරවැසියකුට මොනම දෙය කට වුණත් පොලීසියට යන්නට අද දවසේ විශාල භයක් ඇති වීම පුදුමයක් නොවෙයි. එම නිසා, තම අමාත්‍යාංශය යටතේ ඇති පොලිස් දෙපාර්තමේන්තුවෙන් වුණ මෙම සිද්ධිය ගැන සම්පූර්ණ පරීක්ෂණයක් පවත්වා මෙම ගරු සභාව ඉදිරියේ ප්‍රකාශයක් කරන මෙන් මම කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 6.23

**පොන්සේකා මයා.**
*(திரு. பொன்சேகா)*
(Mr. Fonseka)

නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවසථාවේදී මාත් කාරණයක් මතක් කළ යුතුව තිබෙනවා. මා මේ කාරණය ඉදිරිපත් කරන්නේ කම්කරු ඇමතිතුමාගේ අවධානය යොමු වීම සඳහායි. මගේ ඡන්ද දායක කොට්ඨාශයට අයත් කොච්චිකඩේ "නුරානි" උළු මෝලේ වැඩ කරන හැම ශ්‍රේණියකටම අයත් කම්කරු සහෝදරයන් 400 ක් පමණ පිරිසකුත්, කොන්ත්‍රාත් වැඩ කරන තවත් කම්කරු සහෝදරයන් 200 ක් පමණ පිරිසකුත් වැඩ වර්ජනයක් ආරම්භ කර තිබෙනවා. ඒ කම්කරු සහෝදරයන් ඉදිරිපත් කර තිබෙන ඉල්ලීම් දෙස බලන විට ඒ සම්බන්ධයෙන් චෝදනා නඟන්නට සිදු වෙනවා, කම්කරු දෙපාර්තමේන්තුවටත්.

ඒ කම්කරු සහෝදරයන්ගේ ඉල්ලීම් කිහිපයක් තිබෙනවා. ඔවුන් සෞඛ්‍ය පහසුකම් ඉල්ලනවා. ඔවුන්ට කෑම කන්නට, වතුර බොන්නට නිසි පහසුකම් සලස්වා නැහැ. එසේම සුදුසු වැසිකිළි පවා නැහැ. මෙවැනි ඉල්ලීම් නිසාත් ඔවුන්ට වැඩ වර්ජනයක යෙදෙන්නට සිදු වී තිබෙන බව අප මතක තබා ගන්නට ඕනෑ. මෙවැනි දේවල් පවා ඉල්ලන්නට සිදු වන තැනට කටයුතු සැලසෙන්නට ඉඩ හැර කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් මොනවා කරනවාදැයි මා දන්නේ නැහැ. පිරිසිදු තැන්විමක් දෙන ලෙස ඔවුන් ඉල්ලනවා. මෝලේ වැඩ කරන අතර තුවාළ වුණොත් තුවාළකරු ආරෝග්‍යශාලාවට ගෙන යාම සඳහා වාහනයක් ඉල්ලා ඔවුන් සටන් කරනවා. එසේම පෝය දිනවල කරන අතිරේක වැඩවලට වැටුප් ඉල්ලා සටන් කරනවා. ඒ උළු මෝලේ සේවකයන්ට කොයි තරම් අමානුෂික විධියට සලකා තිබෙනවාද, ඒ හේතුවෙන් ඔවුන් මොන තරම් කල කිරීමකට පත් වී තිබෙනවාද යන්න පැහැදිලිවම පෙනෙනවා, මෝල අයිති බායිට ඉවුම් පිහුම් කරන කෝකියා පවා ඒ වැඩ වර්ජනයට හවුල් වීමෙන්ම. එම නිසා මෝල අයිති බායි දැන් පිටින් කෑම ගෙන්වා ගන්නවා.

අර ඉල්ලීම්වලට අමතරව ඒ කම්කරු සහෝදරයන් තවත් එක ඉල්ලීමක් කරනවා. මාසයකට රුපියල් 195 ක් පමණ වන වැටුපක් ගෙවන ලෙසත් ඔවුන් ඉල්ලනවා. ඇත්තෙන්ම එය ඉතා පහසුවෙන් ගෙවිය හැකි බොහොම සුළු වැටුපක්. ඔවුන්ට දැනට ගෙවන්නේ අරුම පුදුම වැටුපක්. 1963 සිට 1970 දක්වා වූ කාලය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පොන්සේකා මයා.]

වෙනුවෙන් ඒ කම්කරු සහෝදරයන්ගේ වැටුප වැඩි කර තිබෙන්නේ ශත 10 කින් පමණයි. ඒ අනුව හිතා ගන්නට පුළුවනි, ඔවුන්ගේ ශ්‍රමයට සලකන්නේ කොයි තරම් පහත් අන්දමටද කියා.

ඒ කම්කරු සහෝදරයන්ට සෑහෙන වැටුපක් ගෙව්වත් විශාල ලාභයක් ඇති ව එම ආයතනය පවත්වාගෙන යන්නට පුළුවන්කම තිබෙනවා. එම උළු මෝලේ නිපදවෙන එක උළු කැටයක නිෂ්පාදන වියදම වන්නේ සත 12 ටත් 15 ටත් අතර ගණනක්. එහෙත් ඒ උළු කැටයක් විකුණන්නේ සත 42½ කටයි. එම ආයතනයෙන් දවසකට උළු කැට 25,000 ත් 40,000 ත් අතර ගණනක් නිෂ්පාදනය වෙනවා. එපමණක් නොවෙයි. ඒ උළු කැට නිෂ්පාදනය කිරීම සඳහා ජර්මනියෙන් මැෂින් වගයක් ගෙන්වා තිබෙනවා. ඒ මැෂින් නිපදවා තිබුණේ විනාඩියකට උළු කැට 8 බැගින් නිෂ්පාදනය කරන්නට පුළුවන් විධියටයි. එහෙත් එහි සේවය කරන සිංහල කම්කරු සහෝදරයන් ඒ මැෂින්වල වේගය ඉතාමත් වැඩි වන සේ ඒවා සකස් කොට විනාඩියකට උළු කැට 22 ත් 24 ත් අතර ගණන් නිෂ්පාදනය කළ හැකි තත්ත්වයක් ඇති කර තිබෙන බව කම්කරු ඇමතිතුමාට මා ඉතාමත් සන්තෝෂයෙන් දැනුම් දෙන්නට කැමතියි. එහෙත් ඒ තරම් දක්ෂ ලෙස වැඩ කරන ඒ කම්කරු සහෝදරයන්ට ඔවුන් ඉල්ලන සුළු වැටුපවත් දෙන්නට එම උළු මෝල හිමි බායි කැමති නැහැ. ඔහු සම්මාන පුරවැසියෙකැයි මා කියනවා.

දැන් ඔහු තම ආසනයේ සේවය කරන කම්කරු සහෝදරයන් ආරාවුලකට පොළඹවා අමාරුවේ දමන්නට කුමන්ත්‍රණය කරනවා. පසුගිය සතියේ මා කොළඹ එද්දී දැන ගන්නට ලැබුණා, කම්කරු සහෝදරයන් අමාරුවේ දැමීම සඳහා ඊට කලින් දා ඔහු ලස්සණ නාට්‍යයක් රඟ පා තිබෙන බව. මේ කාරණය පිළිබඳව වෙන්නප්පුව පොලීසියට හොඳ අවබෝධයක් තිබෙන නිසා එම පොලීසිය ලවා කම්කරු සහෝදරයන් අමාරුවේ දැමීම අපහසු බැවින් ඔහු කොච්චිකඩේ පොලීසිය ලවා තම ආයතනයේ කම්කරු සමිතියේ නිලධාරි සහෝදරයන් දෙදෙනකු අමාරුවේ දමන්නට උත්සාහ කර තිබෙනවා. එහෙත් එහි පොලිස් පරීක්ෂක මහතාගේ ඥානාන්විත ක්‍රියා මාර්ගය නිසා ඒ කම්කරු සහෝදරයන් දෙදෙනා කරදරයේ නොවැටී බේරුණා.

මේ සියලුම කරුණු කෙරෙහි කාරුණික අවධානය යොමු කොට, තවදුරටත් කට්ටි පනින්නට ඉඩ නොදී මේ වැඩ වර්ජනය සමථයකට පත් කිරීම සඳහා ඒ මෝල අයිති බායියා සාකච්ඡාවකට ගෙන ඒමට තම බලය පාවිච්චි කරන ලෙස කම්කරු ඇමතිතුමාගෙන් මා ඉතා ඕනෑකමින් ඉල්ලා සිටිනවා. මෙවැනි සාධාරණ ඉල්ලීම් උඩ කම්කරු සහෝදරවරුන් වර්ජනය කළාම සාකච්ඡාවකටවත් නොපැමිණ ස්වාමි පක්ෂය කට්ටි පණින්න ගියාම ඒය කෙළවර වෙන්නේ කම්කරු සහෝදරවරුන් ආණ්ඩුවට බැණීමෙනුයි. දෙවෙනි වර බණින්නෙ ස්වාමිපක්ෂයට නොවෙයි; අපේ ආණ්ඩුවටයි. අපේ ආණ්ඩුවක් තිබිලත්, මෙතරම් විශාල බලයක් අපට තිබිලත් කම්කරුවන්ට සුළු පහසුකමක් ඉල්ලා සටන් කරන්නට සිදු වී තිබෙනවා යයි කියමින් ආණ්ඩුවට බණින්න පටන් ගන්නවා. ඒ නිසා අපේ ආණ්ඩුවේ, අපේ රජයේ, හොඳ නම රැක ගැනීම පිණිස මෙවැනි අමානුෂික අන්දමින් ක්‍රියා කරන ස්වාමිවරුන් මර්දනය කොට වැඩ වර්ජන අවස්ථාවලදී ඔවුන් වහාම සාකච්ඡාවලට යොමු කරවන්නට කටයුතු කරන මෙන් මා බොහොම ඕනෑකමින් ගරු කම්කරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 6.28

**සරත් මුත්තෙට්ටුවෙගම මයා.** (කලවාන)
*(திரு. சரத் முத்தெட்டுவெகம—கலவான)*
(Mr. Sarath Muttetuwegama—Kalawana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නිවාස ඇමතිතුමාට කලින් මතක් කර තිබෙන ප්‍රශ්නයක් අහන්ට සිදු වී තිබෙනවා. අද රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථාවේ තාවකාලික කම්කරුවන් ගණනාවක් පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ පහළ මහලට පැමිණියා. අවුරුදු ගණනාවක් තිස්සේ තාවකාලික කම්කරුවන් වශයෙන් වැඩ කළ මේ පිරිස ස්ථිර කිරීම පිළිබඳව නොයෙක් විධියේ ප්‍රකාශන සිදු වී ඇති නමුත් ඇමතිතුමාගෙන් ඒ ගැන ස්ථිර

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප්‍රකාශයක් සිදු වී නැහැ. ඒ නිසා ඇමතිතුමා මේ කම්කරුවන් ස්ථිර කිරීම සම්බන්ධයෙන් ගන්නා පියවර කුමක් දැයි කරුණාකර අපට දැනුම් දෙන්න කියා ඔවුන් ඉල්ලා සිටිනවා.

අ. භා. 6.29

**ගරු සිරිමාවෝ ආර්. ඩී. බණ්ඩාරනායක (අගමැති, රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු ඇමති සහ ක්‍රම සම්පාදන හා රැකීරක්ෂා ඇමති)**

*(கௌரவ சிறிமாவோ ஆர். டி. பண்டார நாயக்க—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளி விவகார அமைச்சரும் திட்டமிடல், வேலைவாய்ப்பு அமைச்சரும்)*

(The Hon. Sirimavo R. D. Bandaranaike—Prime Minister and Minister of Defence & External Affairs and Minister of Planning & Employment)

නියෝජ්‍ය කථානායකතුමනි, ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාගේ (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් කියන්ට තිබෙන්නෙ මෙයයි: ගල්කිස්ස පොලීසියේ ඇති වුණාය කියන සිද්ධිය ගැන අපට දැන ගන්නට ලැබුණු විගසම ඒ ගැන පරීක්ෂණයක් පවත්වන ලෙස නියම කර තිබෙනවා. පරීක්ෂණයෙන් පසු පොලිස් නිලධාරීන් වැරදිකරුවන් බව අපට පෙනී ගියහොත් අප නිසියාකාරව ඒ අයට විරුද්ධව ක්‍රියා කිරීමට සූදානම් බව මේ අවස්ථාවේදී මතක් කරන්ට කැමතියි.

**ගරු එම්. පී. ද සොයිසා සිරිවර්ධන (කම්කරු ඇමති)**

*(கௌரவ எம். பீ. த சொய்சா சிறிவர்தன—தொழில் அமைச்சர்)*

(The Hon. M .P. de Zoysa Siriwardena—Minister of Labour)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වෙන්නප්පුවේ ගරු මන්ත්‍රීතුමා (ෆොන්සේකා මයා.) ඇසූ ප්‍රශ්නය සම්බන්ධයෙන් කියන්ට තිබෙන්නෙ, මේ වගේ ප්‍රශ්නයක් අහන විට මට කලින් ඒ ගැන දැනුම් දෙනවා නම් දෙපාර්තමේන්තුවෙන් ඒ ගැන විමසා නියම පිළිතුරක් දෙන්නට පුළුවන් බවයි. දැන් මට ඒ සම්බන්ධයෙන් කියන්ට තිබෙන්නෙ ඒ ගැන ක්‍රියා කරන බව පමණයි. වෙන්නප්පුවේ ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය විස්තර කළා. මා වහාම ඒ ගැන පරීක්ෂණයක් පවත්වා නියම අන්දමට ක්‍රියා කරන්ට අදහස් කරනවා. මේ අවස්ථාවේ වැඩ වර්ජන කිහිපයක් තිබෙනවා. ඒ සෑම අංශයකම පවතින වැඩ වර්ජන ගැනත් විස්තර කරමින් මේ ප්‍රශ්නයටත් නියම පිළිතුරක් දෙන්නට පුළුවන්කම තිබුණා, කල් වේලා ඇතුව මට මේ ගැන දැනුම් දී තිබුණා නම්. ඒ ගැන ක්‍රියා කරන බව වෙන්නප්පුවේ ගරු මන්ත්‍රීතුමාට මා නැවතත් මතක් කරන්නට කැමතියි.

අ. භා. 6.30

**ගරු කෙනමන්**

*(கௌரவ கெனமன்)*

(The Hon. Keuneman)

The hon. Member for Kalawana (Mr. Muttetuwegama) asked a question about the position with regard to permanency for casual workers in the State Engineering Corporation. For quite a long time the various trade unions of the workers in this corporation and workers who belong to no trade union have been raising this question of making casual workers permanent. I wish to say that this problem is not such a simple problem as one would think, because there are some complicating factors.

The first complicating factor is the nature of the construction industry itself. As you know, those engaged in the construction industry—and that includes the State Engineering Corporation—take on various projects in various parts of the country, and to work on those projects we have to take on a lot of unskilled labour. Our general policy is, as far as possible, to recruit unskilled labour from that locality. When a project ends, normally we would expect the unskilled labour to go somewhere else, because there is no binding on the construction authority to absorb every single person. And that is something that arises out of the nature of the construction industry.

Secondly, there is another complication: we have to balance the respective claims of workers employed by the State Engineering Corporation on a particular project

PUBLIC LIBRARY
JAFFNA.
Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු කෙනමන්]

and persons living in the surrounding villages. As you know, the State Engineering Corporation is a builder: we build for other people; we do not usually build for ourselves. For instance, in Tulhiriya we are building for the National Textile Corporation. We build, and when we have finished the work we hand over and we go away. In the same way, at Salawa we are building for the Plywoods Corporation. We are also building for the Fisheries Corporation and a number of other corporations.

Now, what happens is that our workers, that is, the workers of the State Engineering Corporation who had been working in those building projects, ask that they also be included among the permanent employees of the new corporation. That is to say, the persons who are casual workers of the State Engineering Corporation want to be included in the permanent work force of the corporation that is now being created and to whom we are handing over.

There has been a lot of dispute about this, because other people also want to get employment. Naturally, when you start an industry or a new corporation in a rural area, the people living around the area feel that they should have an opportunity of getting work because they feel that there is no point in merely setting up an industry or a corporation to give somebody else work. So, we have to come to some fair distribution.

I have had discussions with the Minister of Industries, and we have agreed, as a sort of fair working compromise, that in places like Tulhiriya, 50 per cent of the persons who are being taken on for these new works will be persons who are working under the State Engineering Corporation, and 50 per cent will be other members of the general public. In this particular way we are trying to see that permanency will be given to some of the casual workers.

Now, what is the position regarding giving permanency within the State Engineering Corporation itself? Here, I must say that it would not have been difficult for me to have solved this problem early if not for the complications created by my friends of the United National Party Government. I do not know whether the House is aware that prior to the General Election over 4,000—I cannot tell you the exact number, because it is increasing day by day: I was first told it was 3,800; now it is over 4,000; and I still have not got the final report—casual employees were taken on by the State Engineering Corporation, that is, in the period 1969 and the early part of 1970. Now, this has happened in the C. T. B. also and not only in the State Engineering Corporation. I am not blaming the officials of the corporation, for that was the policy of the then Government. In order to pay the salaries of these extra people we require Rs. 10.7 million—that is, 27 per cent of the total wage bill of the corporation. Now, what am I to do, because these four thousand people were taken at a time when there was no justification in terms of the volume of work of the corporation? Actually, the volume of work of the corporation was less in 1969 than it had been in 1968. So, when the volume of work was declining four thousand extra persons had been taken on and an additional 27 per cent is being paid under the wage bill. This is a very serious problem. It is very easy to say, "Immediately give all these people permanency."

In fact, I am faced with what is called a surplus of labour, and I must say that it is a credit—I am not claiming this credit purely for me—for all of us in the Government that even though we have this surplus we are not laying off people. We are trying to find additional work for them. We have not laid off a single person on the grounds of excess of labour. For the last four months we have kept every single person in the State Engineering Corporation and we are now trying to find new work for them. We are going round soliciting work from all government agencies and so on so that we can keep these

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

people in employment. Now, it is in this light that we are considering the question of permanency.

I have appointed a committee. This committee is for the purpose of re-organizing the whole corporation because there are many aspects of the work of the corporation which I feel require reorganization. That committee gave me its substantive report only this morning. I have not had the time to go through that but I had asked them earlier to give me, as a special report, their views on the question of permanency and they did give me a report on permanency a few days—about four or five days—ago ; maybe a week, I cannot remember the exact date. I examined this report together with my officials and I have made recommendations by which a very large proportion of those who have been really employed by the State Engineering Corporation can become permanent.

But I think I should inform hon. Members that this problem of making casual workers permanent is not one that affects the State Engineering Corporation alone. Nearly every other corporation is faced with this problem. Therefore, the Cabinet took a decision to have a uniform policy in regard to this matter and the Cabinet set up a special sub-committee. The chairman of that sub-committee is the Hon. Minister of Finance who is obviously the proper person to be the chairman of that committee because in the end he is the person who has to find the money. The Hon. Minister of Industries and Scientific Affairs is also a member, and I think all Ministers who have corporations under them are in this sub-committee.

This sub-committee has met. I have made recommendations in regard to a phased policy of introducing permanency for those casual workers in the State Engineering Corporation. It would not be correct for me to disclose to this House what my actual recommendations are because this is a matter which is before the sub-committee. I submitted these to the chairman of the sub-committee, the Hon. Minister of Finance, about two or three days ago—I cannot remember the exact date—and I have requested him to summon an early meeting. He has, with all his other problems about the Budget, agreed to summon a meeting and I hope then we can have this matter discussed.

There is a basis in terms of the report for making quite a large number of persons permanent and we hope to be able to do so very soon.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.

*Question put, and agreed to.*

**මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව අ. භා. 6.42 ට අද දින සභා සම්මතිය අනුව, 1970 ඔක්තෝබර් 23 වන සිකුරාදා අ. භා. 2 වන තෙක් කල් ගියේ ය.**

*அதன்படி, பி. ப. 6.42 க்கு சபை அதனது இன்றைய தீர்மானத்திற் கிணங்க, 1970 ஒக்ரோபர் 23, வெள்ளிக்கிழமை பி. ப. 2 மணிவரை ஒத்திவைக்கப்பெற்றது.*

*Adjourned accordingly at 6.42 P.M. until 2 P.M. on Friday, 23rd October 1970, pursuant to the Resolution of the House this day.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු

## வினாக்களுக்கு எழுத்துமூல விடைகள்

## WRITTEN ANSWERS TO QUESTIONS

### ඇහැටුවැව මහා විද්‍යාලය : විද්‍යාගුරුවරයා

எஹத்துவெவ மகா வித்தியாலயம் : விஞ்ஞான ஆசிரியர்

EHETUWEWA MAHA VIDYALAYA : SCIENCE TEACHER

47/70

**තිස්ස ආර්. බලල්ල මයා.** (යාපහුව)
*(திரு. திஸ்ஸ ஆர். பலல்ல—யாபஹுவ)*
(Mr. Tissa R. Balalle—Yapahuwa)

අධ්‍යාපන ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය : (අ) කු/ඇහැටුවැව මහා විද්‍යාලයේ රසායනාගාරය තනා නිම කොට උපකරණ සපයා ඇති බව එතුමා දන්නවාද? (ආ) විද්‍යා පහසුකම් ඇති කිට්ටුම පාසල පිහිටා තිබෙන්නේ ඇහැටුවැව සිට සැතපුම් 25 ක් දුරින් බව එතුමා දන්නවාද? (ඉ) ඇහැටුවැව මහා විද්‍යාලයේ සිටි විද්‍යා ගුරුවරයා මාරු කළායින් පසුව එම විද්‍යාලයට විද්‍යා ගුරුවරයෙකු පත් කර නැති බව එතුමා දන්නවාද? (ඊ) මෙම විද්‍යාලයට විද්‍යා ගුරුවරයෙකු පත්කිරීමට එතුමා වහාම ක්‍රියා කරනවාද? (උ) එසේ නම්, ඒ කවදාද?

*கல்வி அமைச்சரைக் கேட்ட வினா: (அ)* Ku/*எஹத்துவெவ ம. ம. வித்தியாலயத்தில் இப்பொழுது விஞ்ஞான ஆய்கூடம் அமைக்கப்பட்டு உரிய சாதனங்களுமிடப்பட்டிருப்பதை அவர் அறிவாரா? (ஆ) விஞ்ஞான வசதிகள் கொண்ட அடுத்த பாடசாலை எஹத்துவெவவிலிருந்து 25 மைல் தொலைவில் இருக்கிறது என்பதை அவர் அறிவாரா? (இ) எஹத்துவெவ மகா வித்தியாலயத்திலிருந்த முந்திய விஞ்ஞான ஆசிரியர் இடமாற்றஞ் செய்யப்பட்ட பின்னர், அங்கு விஞ்ஞான ஆசிரியர் எவரும் நியமிக்கப்படவில்லை யென்பதை அவர் அறிவாரா? (ஈ) இப்பாடசாலைக்கு ஒரு விஞ்ஞான ஆசிரியரை நியமிக்க அவர் உடனடியாக நடவடிக்கை மேற்கொள்வாரா? (உ) ஆமெனில், எப்போது?*

asked the Minister of Education: (*a*) Is he aware that the science laboratory has been built and equipped now at Ku/Ehetuwewa M.M.V.? (*b*) Is he aware that the nearest school with science facilities is 25 miles away from Ehetuwewa? (*c*) Is he aware that there is no science teacher appointed to Ehetuwewa Maha Vidyalaya since the last teacher was transferred? (*d*) Will he take immediate action to appoint a science teacher to this school? (*e*) If so, when?

**ගරු බදිඋද්දීන් මහ්මූද්** (අධ්‍යාපන ඇමති)
*(கௌரவ பதியுத்தீன் மஹ்மூத்—கல்வி அமைச்சர்)*
(The Hon. Badiuddin Mahmud—Minister of Education)

(අ) ඔව්. (ආ) ඔව්. (ඉ) නැත. විද්‍යා ගුරුවරුන් දෙදෙනකුම සිටින අතර, ඔවුන් කිසිවකු මාරු කර නැත. ගණිත ගුරුවරයා මාරු කරන ලද නමුත් පසුව ඔහුගේ ස්ථාන මාරුව අවලංගු කරන ලදී. (ඊ) පැන නොනගී. (උ) පැන නොනගී.

*(அ) ஆம். (ஆ) ஆம். (இ) இல்லை. பாடசாலையில் இரண்டு விஞ்ஞான ஆசிரியர்கள் இருக்கிறார்கள்; ஒருவரும் மாற்றப்படவில்லை. எனினும், கணித ஆசிரியர் மாற்றப்பட்டு பின்னர் அம்மாற்றம் இரத்துச் செய்யப்பட்டது. (ஈ) இவ்வினா எழவில்லை. (உ) இவ்வினா எழவில்லை.*

(*a*) Yes. (*b*) Yes. (*c*) No. There are two science teachers in the school and neither one has been transferred out. However, the mathematics teacher was transferred and the transfer was cancelled subsequently. (*d*) Does not arise. (*e*) Does not arise.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org